කාර්යසාධන වාර්තාව - 2019

වැය ශීර්ෂ අංකය : 238

රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන
අමාත්‍යාංශය
කොළඹ 01

පටුන

1.0 **හැඳින්වීම** **3**

1.1 සමාලෝචනය 3
1.2 දැක්ම සහ මෙහෙවර 4
1.3 විෂය පථය සහ ක්‍රියාකාරිත්වය 5
1.4 ආයතනික ව්‍යුහය 6

2.0 **ප්‍රගතිය සහ අනාගත දැක්ම** **7**

2.1 රජයේ ආදායම් කාර්යසාධනය 7
2.1.1 බදු ආදායම 7
2.1.2. බදු නොවන ආදායම **12**

3.0 **2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සමස්ථ මූල්‍ය කාර්යසාධනය** **19**

3.1 මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශය 19
3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 22
3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය 23
3.4 මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් 24
3.5 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය 25
3.6 ප්‍රතිපාදන උපයෝගි කර ගැනීමේ කාර්යසාධනය 25
3.7 අනෙකුත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු නියෝජිතයකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට වියදම් සඳහා ප්‍රතිපාදනය කිරීම 26
3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය 26
3.9 විගණකාධිපතිගේ වාර්තාව 26

4.0 **කාර්යසාධන දර්ශකය** **27**

4.1 ආයතනයේ කාර්යසාධන දර්ශකය (ක්‍රියාකාරි සැලැස්ම මත පදනම්ව) 27

5.0 **සාක්ෂාත් කරගත හැකි තිරසාර සංවර්ධන ඉලක්ක වල කාර්යසාධනය (SDG)** **27**

5.1 හඳුනාගත් අදාල තිරසාර සංවර්ධන අරමුණු 27
5.2 තිරසාර සංවර්ධන අරමුණු වල අභියෝග 27

6.0 **මානව සම්පත් හැකියාව** **28**

6.1 සේවක කළමනාකරණය 28
6.2 කාර්ය මණ්ඩලයේ ධාරිතා සංවර්ධනය 28
6.3 මානව සම්පත් සංවර්ධනය 28

7.0 **අනුකූලතා වාර්තාව** **30**

වගු

2.1 වගුව : රාජ්‍ය ආදායමේ සාරාංශය 7
2.2 වගුව : ආදායම් බදු කාර්යසාධනය 8
2.3 වගුව : එකතු කළ අගය මත බදු ආදායම 9
2.4 වගුව : නිෂ්පාදන බදු ආදායම 10
2.5 වගුව : බදු නොවන ආදායම 12

රූපසටහන්

2.1. රූප සටහන : බදු ආදායමේ සංයුතිය 8

2.2 රූප සටහන : දුම්වැටි නිෂ්පාදනය සහ නිෂ්පාදන බදු ආදායම 11

ඇමුණුම්

11 : විගණකාධිපතිවරයාගේ වාර්තාව 37

1.0 හැඳින්වීම

1.1 සමාලෝචනය

රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ මූලික පරමාර්ථය වනුයේ අපේක්ෂිත ආර්ථික හා සමාජයීය අභිමතාර්ථයන් මුදුන් පමුණුවා ගැනීම සඳහා අදාළ ආයතන, රේඛීය අමාත්‍යාංශ, වෙනත් ආයතන සහ පුද්ගලික අංශයේ ආයතන සමඟ මනා සහසම්බන්ධයකින් යුතුව රජයේ පුළුල් සංවර්ධන රාමුව තුළ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය සම්පාදනය කිරීම සහ ක්‍රියාත්මක කිරීමයි.

රටේ බදු ප්‍රතිපත්තිය සැකසීම මෙන්ම ආදායම්, වියදම් සහ වෙනත් මූල්‍ය විශ්ලේෂණය හා දේශීය, විදේශීය සාර්ව ආර්ථික ප්‍රවණතා විශ්ලේෂණය තුළින් අපේක්ෂිත ප්‍රතිඵල සාක්ෂාත් කර ගැනීම සඳහා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියෙහි සුදුසු පරිදි වෙනස්කම් සිදුකිරීම සඳහා පහසුකම් සැපයීම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන වගකීමයි.

තවද රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත යටතේ ක්‍රියාත්මක කළ යුතු අවශ්‍යතාවයන් වන රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය වාර්තාව, අයවැය, ආර්ථික සහ රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව, වසර මැද මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව, වසර අවසාන අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාව සහ පූර්ව මැතිවරණ අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාව ප්‍රකාශයට පත් කිරීම ද දෙපාර්තමේන්තුවේ කාර්යභාරයක් වේ.

1.2 දැක්ම සහ මෙහෙවර

දැක්ම

තිරසාර රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියක් ස්ථාපිත වීම සහතික කිරීම

මෙහෙවර

රජයේ පුළුල් සංවර්ධන ක්‍රියාරාමුව තුළ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය සම්පාදනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම

1.3 කාර්යයන්

පෞද්ගලික, රාජ්‍ය සහ ජාත්‍යන්තර නියෝජිතයන් සම්බන්ධීකරණය කරමින් මධ්‍යකාලීන අයවැය රාමුවක් තුළ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය සම්පාදනය කිරීම.

බදු ප්‍රතිපත්ති සහ ඊට අදාළ අනෙකුත් අණපනත් සකස් කිරීම (තීරුබදු සහ විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද හැර)

ආදායම් රැස් කරන ආයතන සමඟ මනා සම්බන්ධීකරණයක් පවත්වා ගනිමින් රාජ්‍ය ආදායම් සහ ලැබීම් ඇතුළත් ව රාජ්‍ය මූල්‍ය පෙළගැස්ම සහ රාජ්‍ය මූල්‍ය ක්‍රියාකාරිත්වය කළමනාකරණය සහ නිරීක්ෂණය.

රජය විසින් වරින්වර ගනු ලබන ප්‍රතිපත්තිමය තිරණ වලට අනුව නීතිමය සංශෝධන කිරීමට අදාළ කටයුතු හැසිර වීම.

සියලුම වාර්තාකරණයන් ඇතුළත්ව 2003 අංක 03 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත ක්‍රියාත්මක කිරීම.

රාජ්‍ය මූල්‍ය හා සාර්ව ආර්ථික කරුණු වලට අදාළ සමීක්ෂණ හා විශ්ලේෂණ සිදු කිරීම.

1.4 ආයතනික ව්‍යුහය



2.0 ප්‍රගතිය සහ අනාගත දැක්ම

2.1 රජයේ ආදායම් කාර්ය සාධනය

දළ දේශීය නිෂ්පාදනයෙහි ප්‍රතිශතයක් ලෙස 2017 වසරේ දී සියයට 13.7 ක් ලෙස වාර්තා වූ සමස්ත රාජ්‍ය ආදායම 2019 වසරේ දී සියයට 12.6 දක්වා අඛණ්ඩව වසර තුනක් මුළුල්ලේ අවප්‍රමාණය වී ඇත. රාජ්‍ය ආදායම වර්ධනය කර ගැනීමට ගන්නා ලද දැඩි ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ලෙස බදු අනුපාතික ඉහළ දැමීම මෙන්ම බදු පදනම පුළුල් කිරීම හමුවේ වුවද, දුර්වල ආර්ථික කටයුතු හේතුවෙන් අපේක්ෂිත පරිදි බදු සහ බදු නොවන රාජ්‍ය ආදායම් ඉලක්ක සපුරාගැනීමට නොහැකි විය. ආදායම් බදු හැර අනෙකුත් ආදායම් එක්රැස් කිරීමේ දුර්වලතා හේතුවෙන් නාමික වශයෙන් ගත් කළ, රාජ්‍ය ආදායම 2018 වසරේ වාර්තා වූ රු. බිලියන 1,831.5 සිට 2019 වසරේ දී රු. බිලියන 1,890.9 දක්වා රු. බිලියන 59 කින් සහ සියයට 3.2 කින් ආන්තිකව ඉහළ ගොස් ඇත. දේශීය සහ ආනයන බදු මෙන්ම බදු නොවන ආදායම් එක්රැස් කිරීම පහත වැටීම හේතුවෙන් රාජ්‍ය ආදායම 2018 වසරේ වාර්තා වූ රු. බිලියන 1920.0 සිට 2019 වසරේ දී රු. බිලියන 1890.9 දක්වා සියයට 1.5 කින් පහත වැටුණි. ආදායම් බදු මඟින් ලද ආදායම ඉහළ යාමක් පෙන්නුම් කළ ද, සුරා බද්ද, එකතු කළ අගය මත බද්ද, වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බද්ද, ජාතිය ගොඩනැගීමේ බද්ද, සෙස් බද්ද සහ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද වැනි අනෙකුත් දේශීය හා ආනයන බදු වල දුර්වල කාර්යසාධනය මධ්‍යයේ සමස්ත බදු ආදායම 2018 වසරේ වාර්තා වූ රු. බිලියන 1,712.3 සිට 2019 වසරේ දී රු. බිලියන 1,734.9 දක්වා සියයට 1.3 කින් සුළු වශයෙන් වර්ධනය වී ඇත. ගාස්තු හා අයකිරීම් මගින් ලද ආදායම පහත වැටීම සහ ශ්‍රී ලංකා මහ බැංකුවෙන් ලාභ පැවරුම් වාර්තා නොවීම හේතුවෙන් බදු නොවන ආදායම ද ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස මෙන්ම නාමික වශයෙන් යන දෙඅංශයෙන්ම 2019 වසරේ දී සැලකිය යුතු ලෙස පහත වැටුණි. ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස බදු නොවන ආදායම 2018 වසරේ දී වාර්තා වූ සියයට 1.4 සිට 2019 වසරේ දී සියයට 1.0 දක්වා සියයට 0.4 කින් ද පහත වැටුණු අතර, නාමික වශයෙන් බදු නොවන ආදායම 2018 වසරේ වාර්තා වූ රු. බිලියන 207.7 සිට 2019 වසරේ දී රු. බිලියන 156.0 දක්වා සියයට 24.9 කින් සැලකිය යුතු ලෙස පහත වැටී ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, පවත්නා තත්‍ය ආදායම, අපේක්ෂිත ඇස්තමේන්තුගත ආදායම වන රු. බිලියන 2344.0 හා සැසඳීමේදී සියයට 80.7 ලෙස පහත වැටී ඇත. 2019 වසරේ බදු නොවන ආදායම සාක්ෂාත් කරගැනීම ඇස්තමේන්තුගත ආදායමින් සියයට 58.4 ක් විය.

2.1 වගුව : රාජ්‍ය ආදායමේ සාරාංශය

රු. මිලි.

අයිතමය	2016	2017	2018	2019 (තාවකාලික)
මුළු ආදායම සහ ප්‍රදාන	**1,693,557**	**1,839,562**	**1,932,459**	**1,898,808**
මුළු ආදායම	**1,686,061**	**1,831,531**	**1,919,974**	**1,890,899**
බදු ආදායම	1,463,689	1,670,178	1,712,318	1,734,925
ආදායම් බදු	258,857	274,562	310,449	427,699
භාණ්ඩ හා සේවා මත බදු	841,967	1,025,799	1,061,751	975,557
විදේශ වෙළෙඳාම මත බදු	362,865	369,817	340,117	331,668
බදු නොවන ආදායම්	222,372	161,353	207,656	155,974
ප්‍රදාන	**7,496**	**8,031**	**12,485**	**7,909**
		ද.දේ.නි.ප්‍රතිශතයක් ලෙස		
ආදායම සහ ප්‍රදන	**14.1**	**13.8**	**13.5**	**12.6**
මුළු ආදායම	**14.1**	**13.7**	**13.4**	**12.6**
බදු ආදායම	12.2	12.5	11.9	11.6
බදු නොවන ආදායම	1.9	1.2	1.4	1.0
ප්‍රදන	**0.1**	**0.1**	**0.1**	**0.1**

2.1.1. බදු ආදායම

සෘජු හා වක්‍ර බදු ඇතුළත්ව රාජ්‍ය බදු ආදායම ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස 2018 වසරේ පැවති සියයට 11.9 සිට 2019 වසරේ දී 11.6 ක් දක්වා පහත වැටුණි. කෙසේ වුවද, බදු ආදායම නාමික වශයෙන් ගත් කළ පෙර වසරේ දී වාර්තා වූ රු. බිලියන 1,712.3 සිට 2019 වසරේ දී රු. බිලියන 1,734.9 ක් දක්වා සියයට 1.3 කින් සුළු වශයෙන් වැඩි වූ අතර, එම වර්ධනය 2019 වසරේ ඇස්තමේන්තුගත රු. බිලියන 2,077 ක් වූ බදු ආදායමෙන් සියයට 16.5 ක අපගමනයකි. සුරාබදු සහ රේගු ආනයන බදු ආදායම සුළු වශයෙන් වර්ධනය වුවද, එකතු කළ අගය මත බද්ද, ජාතිය ගොඩනැගීමේ බද්ද, මෝටර් වාහන, ඛනිජතෙල් නිෂ්පාදිත සහ දුම් වැටි මත නිෂ්පාදන බද්ද, විශේෂ භාණ්ඩ බද්ද, වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බද්ද, සෙස් බද්ද සහ විදුලි සංදේශ බද්ද මඟින් ලද ආදායම පහළ යෑම මෙම අපගමනයට හේතුවිය. වක්‍ර බදු මගින් ලද ආදායම බදු ආදායමින් සියයට 75.3 ක් විය. 2019 වසරේ වක්‍ර බදු ආදායම සඳහා භාණ්ඩ හා සේවා මත බදු සහ විදේශ වෙළඳාම මත බදු මගින් පිළිවෙලින් සියයට 74.6 ක හා සියයට 25.4 ක දායකත්වයක් ලබා දී ඇත.

2.1. රූප සටහන බදු ආදායමේ සංයුතිය



නව දේශීය ආදායම් පනත ක්‍රියාත්මක කිරීමේ බලපෑම පිළිබිඹු කරමින්, ඍජු බදු ආදායම ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස මෙන්ම නාමික වශයෙන් යන දෙඅංශයෙන්ම කැපී පෙනෙන ලෙස ඉහළ ගිය අතර, සංස්ථාපිත සහ සංස්ථාපිත නොවන ආදායම් බද්ද, උපයන විට ගෙවීමේ බද්ද, ආර්ථික සේවා ගාස්තු සහ පොලී ආදායම මත රඳවා ගැනීමේ බද්ද මඟින් ලද ආදායම ඉහළ යාම හේතුවෙන් ඍජු බදු ආදායම පවත්නා බදු ආදායමෙන් සියයට 24.7 ක දායකත්වයක් දරන ලදී. ආදායම් බදු මගින් ලද ආදායම ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස 2018 වසරේ වාර්තා වූ සියයට 2.2 සිට 2019 වසරේ දී සියයට 2.8 දක්වා සියයට 0.6 කින් ඉහළ ගිය අතර, නාමික වශයෙන් ගත් කල, ආදායම් බදු ආදායම 2018 වසරේ වූ රු. බිලියන 310.4 සිට 2019 වසරේ දී රු. බිලියන 427.7 දක්වා සියයට 37. 8 කින් කැපී පෙනෙන ලෙස වැඩි විය.

ආදායම් බද්ද

උපයන විට ගෙවීම් බදු, ආර්ථික සේවා ගාස්තු සහ පොලී ආදායම මත රඳවා ගැනීම් බදු ඇතුළු සංස්ථාපිත හා සංස්ථාපිත නොවන බදු මගින් ලද ආදායම ඉහළයාම හේතුවෙන් ආදායම් බදු වලින් ලද ආදායම ඉහළ නැගීමට හේතු විය. ඍජු බදු තුළින් ලද ආදායම සමස්ත බදු ආදායමෙහි ප්‍රතිශතයන් ලෙස 2018 වසරේ පැවති සියයට 18.1 සිට 2019 වසරේ දී සියයට 24.7 දක්වා ඉහළ ගොස් ඇත.

2.2 වගුව: ආදායම් බදු කාර්යසාධනය

රු. මිලි.

අයිතමය	2017	2018	2019	වර්ධනය %
මුළු ආදායම් බදු	**274,562**	**310,450**	**427,699**	**37.8**
සංස්ථාපිත හා සංස්ථාපිත නොවන බදු	143,588	169,672	272,602	60.7
උපයන විට ගෙවීමේ බදු	32,920	41,385	49,445	19.5
ආර්ථික සේවා ගාස්තු	44,720	52,979	55,301	4.4
පොලිය මත රඳවා ගැනීමේ බදු	53,334	46,414	50,351	8.5

සංස්ථාපිත හා සංස්ථාපිත නොවන බදු මගින් ලද ආදායම 2018 වසරේ වාර්තා වූ රු. බිලියන 169.6 සිට 2019 වසරේ දී රු. බිලියන 272.6 දක්වා සියයට 60.8 කින් කැපී පෙනෙන ලෙස ඉහළ ගොස් ඇත. 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත ක්‍රියාවට නැංවීම මගින් සංස්ථාපිත බදු ව්‍යුහයේ පදනම පුළුල් කිරීම මෙන්ම බදු පරිපාලන

ක්‍රියාවලිය වැඩි දියුණු වීම පිළිබිඹු කරමින් සංස්ථාපිත බදු ආදායම සමස්ත ආදායම් බදු වලින් ලද ආදායමෙහි ප්‍රතිශතයක් ලෙස ගත් කළ සියයට 95.8 දක්වා වැඩි විය. ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය (RAMIS) ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵලයක් ලෙස උපයන විට ගෙවීම් බදු ආදායම 2018 වසරේ වාර්තා වූ රු. බිලියන 41.4 සිට 2019 වසරේදී රු. බිලියන 49.4 දක්වා සියයට 19.5 කින් වර්ධනය විය. පිරිවැටුම පදනම්ව ආර්ථික සේවා ගාස්තු රැස් කිරීම තුළින් ලද ආදායම 2018 වසරේ වාර්තා වූ රු. බිලියන 53.0 සිට 2019 වසරේදී රු. බිලියන 55.3 දක්වා සියයට 4.4 කින් ඉහළ නැගුණි.

එකතු කළ අගය මත බද්ද

දේශීය ආර්ථික ක්‍රියාකාරකම් තුළ ඇති වූ මන්දගාමීත්වය සහ ආනයන ආශ්‍රිත ක්‍රියාකාරකම් හැකිලීම එකතු කළ අගය මත බදු ආදායම පහළ යාමට ප්‍රධාන වශයෙන් හේතු විය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, එකතු කළ අගය මත බදු ආදායම පවතින බදු ආදායමේ ප්‍රතිශතයක් ලෙස 2018 වසරේ පැවති සියයට 27.0 සිට 2019 වසරේ දී සියයට 25.6 ක් දක්වා තීව්‍ර ලෙස පහත වැටුණි. එකතු කළ අගය මත බදු ආදායම ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස ගත් කළ එම ආදායම 2018 වසරේ වාර්තා වූ සියයට 3.2 සිට 2019 වසරේ දී සියයට 3.00 ක් දක්වා අඩු විය. නාමික වශයෙන් ගත් කළ, එම ආදායම 2018 වසරේ වාර්තා වූ රු. බිලියන 461.6 සිට 2019 වසරේ දී රු. බිලියන 443.9 ක් දක්වා සියයට 3.9 කින් සාමාන්‍ය වශයෙන් පහළ වැටුණි. දේශීය ආර්ථික ක්‍රියාකාරකම් මත පදනම් වූ එකතු කළ අගය මත බදු මගින් ලද ආදායම 2018 වසරේ පැවති රු. බිලියන 282.5 සිට 2019 වසරේ දී රු. බිලියන 274.0 ක් දක්වා සියයට 3.0 කින් පහත වැටුණි. එකතු කළ අගය මත ඉහළම බදු ආදායමට ඉහළම දායකත්වයක් ලබා දුන් මූල්‍ය සේවා වලින් ලද එකතු කළ අගය මත බදු ආදායම රුපියල් බිලියන 49.8 දක්වා සියයට 10.8 කින් ද අනෙකුත් සේවා වලින් ලද එකතු කළ අගය මත බදු ආදායම රු. බිලියන 138.9 ක් දක්වා සියයට 5.5 කින් ද 2019 වසරේ දී අඩු විය. නිෂ්පාදන අංශයෙන් ලද එකතු කළ අගය මත බදු ආදායම රු. බිලියන 85.2 ක් දක්වා සියයට 6.4 කින් වර්ධනය විය. මේ අතර, ආනයනයන් මත එකතු කළ අගය මත බදු මගින් ලද ආදායම ද 2018 වසරේ වූ රු. බිලියන 179.2 සිට 2019 වසරේ දී රු. බිලියන 170.0 ක් දක්වා සියයට 5.2 කින් පහත වැටුණි. මන්දගාමී ආනයන ක්‍රියාකාරකම් මධ්‍යයේ වුව ද, ගල් අඟුරු, කිරිපිටි, සිමෙන්ති, වානේ කුට්ටි සහ සිමෙන්ති ක්ලින්කර් ආනයනයන් මගින් ලද ආනයන මත පදනම් වූ එකතු කළ අගය මත බදු ආදායම සඳහා ඉහළම දායකත්වයක් ලබා දෙන ලදී. 2019 වසරේ අවසානයේ දී එකතු කළ අගය මත බදු අනුපාතිකය සියයට 15 සිට 8 දක්වා අඩුකිරීම මෙන්ම එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි වීමේ අවම ආදායම් සීමාව ඉහළ දැමීම, කෙටිකාලීනව එකතු කළ අගය මත බදු ආදායමට බලපානු ලැබුවද, ආර්ථික ක්‍රියාකාරකම්වල වර්ධනය සහ සමස්ත ඉල්ලුමේ ඉහළ යාමත් සමඟින් මධ්‍යකාලීනව එම බදු ආදායම ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ.

2.3 වගුව: එකතු කළ අගය මත බදු ආදායම

රු. මිලි.

අයිතමය	2014	2015	2016	2017	2018	2019
දේශීය	140413	131,662	168,817	276,065	283,327	275,089
ආනයන	136221	89,174	115,339	168,394	179,163	169,914
දළ ආදායම	**276634**	**220,836**	**284,156**	**444,459**	**462,490**	**445,003**
ආපසු ගෙවීම	1284	1,136	686	720	840	1,126
ශුද්ධ ආදායම	**275350**	**219,700**	**283,470**	**443,739**	**461,651**	**443,877**
ශුද්ධ ආදායම ද.දේ.නි. % ලෙස	**2.7**	**2.0**	**2.4**	**3.3**	**3.2**	**3.0**

ජාතිය ගොඩනැගීමේ බද්ද

2019 වසරේ දී ජාතිය ගොඩනැගීමේ බදු ආදායම ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 0.5 මට්ටමේ නොවෙනස්ව පැවතුණි. කෙසේ වුවද, ජාතිය ගොඩනැගීමේ බදු ආදායම මුළු බදු ආදායමට දැක් වූ දායකත්වය 2018 වසරේ වාර්තා වූ සියයට 4.2 සිට 2019 වසරේ දී සියයට 4.1 ක් දක්වා පහත වැටුණි. නාමික වශයෙන් ගත් කළ, 2019 වසරේ දී දේශීය ආර්ථික ක්‍රියාකාරකම් මෙන්ම ආනයන ආශ්‍රිත ක්‍රියාකාරකම් දුර්වලවීම හේතුවෙන් ජාතිය ගොඩනැගීමේ බදු ආදායම සුළු වශයෙන් පහත වැටුණි. ඒ අනුව, ජාතිය ගොඩනැගීමේ බදු ආදායම 2018 වසරේ වාර්තා වූ රු. බිලියන 71.3 සිට 2019 වසරේ දී රු. බිලියන 70.7 ක් දක්වා සියයට 1.0 කින් පහත වැටුණි. කෙසේ වුවද, දේශීය ආර්ථික ක්‍රියාකාරකම් මගින් ලද ජාතිය ගොඩනැගීමේ බදු ආදායම 2018 වසරේ පැවති රු. බිලියන 51.2 සිට 2019 වසරේ දී රු. බිලියන 52.4 ක් දක්වා සියයට 2.4 කින් සුළු වශයෙන් වැඩි වූ අතර, ආනයන ආශ්‍රිත ක්‍රියාකාරකම් මගින් ලද ජාතිය ගොඩනැගීමේ බදු ආදායම 2018 වසරේ වූ රු. බිලියන 20.2 සිට 2019 වසරේ දී රු. බිලියන 18.2 ක් දක්වා සියයට 9.2 කින් පහත වැටුණි. සේවා අංශයෙන් ලද ජාතිය ගොඩනැගීමේ බදු ආදායම පෙර වසරේ වාර්තා වූ රු. බිලියන 40.0 සිට 2019 වසරේ දී රු. බිලියන 39.7 ක් දක්වා සියයට 0.6 කින් සුළු වශයෙන් පහළ වැටුණු අතර, නිෂ්පාදන අංශයෙන් ලද ආදායම 2018 වසරේ වූ රු. බිලියන 11.2 සිට 2019 වසරේ දී රු.

බිලියන 12.7 ක් දක්වා සියයට 13.5 කින් වර්ධනය විය. කිරිපිටි, ජංගම දුරකථන, වානේ කූට්ටි සහ සිමෙන්ති ආනයනයන් මගින් ලද ආදායම ආනයනයන් මත ජාතිය ගොඩනැගීමේ බදු ආදායමට ප්‍රධාන වශයෙන් දායක විය.

නිෂ්පාදන/සුරා බද්ද

සමස්ත බදු ආදායමට ඉහළම දායකත්වයක් ලබාදෙන නිෂ්පාදන/සුරා බදු ආදායම 2019 වසරේ දී මත්පැන් වලින් ලද සුරා බදු ආදායමෙහි සුළු වැඩිවීම මධ්‍යයේ වුවද, මෝටර් වාහන, ඛනිජතෙල් නිෂ්පාදිත සහ දුම් වැටි මත නිෂ්පාදන බදු ආදායම පහළ යෑම හේතුවෙන් ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස මෙන්ම නාමික වශයෙන් යන දෙඅංශයෙන්ම පහත වැටුණි. නිෂ්පාදන/සුරා බදු ආදායම ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස 2018 වසරේ වාර්තා වූ සියයට 3.4 සිට 2019 වසරේ දී සියයට 2.7 දක්වා ප්‍රතිශතාංක 0.7 කින් අඩු විය. නිෂ්පාදන/සුරා බදු ආදායම 2018 වසරේ වූ රු. බිලියන 484.2 සිට 2019 වසරේ දී රු. බිලියන 399.5 ක් දක්වා සියයට 17.5 කින් නාමික වශයෙන් පහත වැටුණි. කෙසේ වුවද, 2019 වසරේ සමස්ත බදු ආදායමට සියයට 23.0 ක දායකත්වයක් ලබාදෙමින් බදු ආදායම සඳහා ඉහළම දායකත්වයක් ලබාදෙන ප්‍රභවය ලෙස නිෂ්පාදන/සුරා බද්ද තවදුරටත් පැවතුණි.

2.4 වගුව : නිෂ්පාදන බදු ආදායම

රු. මිලි.

අයිතමය	2014	2015	2016	2017	2018	2019
මත්පැන්	69,100	105,234	120,238	113,684	113,944	115,443
දුම්වැටි/දුම්කොළ	57,204	79,981	88,752	85,956	92,198	87,367
මෝටර් වාහන	98,531	263,470	186,499	189,740	204,081	130,378
ඛනිජ තෙල් නිෂ්පාදන	28,732	45,092	55,719	73,983	66,318	61,740
අනෙකුත්	3,087	3,812	3,704	6,091	7,701	4,549
එකතුව	**256,654**	**497,589**	**454,912**	**469,454**	**484,242**	**399,478**

2019 අයවැය මගින් යෝජනා කළ පරිදි, ඝන සෙන්ටිමීටර් 2,000 ට වඩා අඩු එන්ජින් ධාරිතාවයකින් යුත් මෝටර් වාහන සඳහා නිෂ්පාදන බදු ඉහළ දැමීම මෙන්ම මෝටර් වාහන මත සුඛෝපභෝගී බද්ද පැනවීම වැනි ආනයන අධෛර්යමත් කිරීමේ ප්‍රතිපත්ති හේතුවෙන් මෝටර් වාහන ආනයනයන් මත නිෂ්පාදන බදු මගින් ලද ආදායම 2018 වසරේ වූ රු. බිලියන 204.1 සිට 2019 වසරේ රු. බිලියන 130.4 ක් දක්වා සියයට 36.1 කින් පහත වැටුණි. නිෂ්පාදන බදු සංශෝධනය සහ සුඛෝපභෝගී මෝටර් රථ බද්දට අමතරව රජයේ නිලධාරීන් සඳහා සහනදායී බලපත්‍ර යෝජනා ක්‍රමය යටතේ වාහන ආනයනය සඳහා ණයවර ලිපි නිකුත් කිරීම 2019 වසරේ අප්‍රේල් මස දක්වා තාවකාලිකව අත්හිටුවීම, මෝටර් වාහන මත වූ නිෂ්පාදන බදු මගින් ලද ආදායම කෙරෙහි අහිතකර ලෙස බලපාන ලදී. ඉහත බාධාවන් සමස්ත නිෂ්පාදන/සුරා බදු ආදායමට මෝටර් වාහන මත වූ නිෂ්පාදන බදු ආදායමෙන් ලබාදෙන දායකත්වය 2018 වසරේ වාර්තා වූ සියයට 42.1 සිට 2019 වසරේ දී සියයට 32.6 ක් දක්වා පහත වැටීමට දායක විය.

ප්‍රධාන වශයෙන් 2018 වසරේ නොවැම්බර් මස සිට ඔටෝ ඩීසල් ආනයනයන් මත පනවන ලද නිෂ්පාදන බද්ද ලීටරයකට රු. 13.00 සිට රු. 6.00 දක්වා අඩුකිරීම මෙන්ම 2019 වසරේ ඩීසල් ආනයනය පහත යෑම හේතුවෙන් ඛනිජතෙල් නිෂ්පාදිත වලින් ලද නිෂ්පාදන බදු ආදායම 2018 වසරේ වාර්තා වූ රු. බිලියන 66.3 සිට 2019 වසරේ දී රු. බිලියන 61.7 ක් දක්වා සියයට 6.9 කින් අඩු විය. දුම් වැටි මත වන නිෂ්පාදන බදු අවස්ථා කිහිපයක දී ඉහළ දැමීම සමඟින් සැලකිය යුතු ලෙස දුම් වැටි නිෂ්පාදනය පහළ යෑම පිළිබිඹු කරමින් දුම් වැටි මගින් ලද බදු ආදායම ද 2018 වසරේ වූ රු. බිලියන 92.2 සිට 2019 වසරේ දී රු. බිලියන 87.4 ක් දක්වා සියයට 5.2 කින් පහත වැටුණි. තවද, පාන වර්ග සහ ප්ලාස්ටික් රෙසින ඇතුළු අනෙකුත් භාණ්ඩ මගින් ලද නිෂ්පාදන බදු ආදායම ද 2018 වසරේ වූ රු. බිලියන 7.7 සිට 2019 වසරේ දී රු. බිලියන 4.5 ක් දක්වා සියයට 40.9 කින් පහත වැටුණි. කෙසේ වුවද, 2018 වසරේ මාර්තු මස සිට සියලුම මත්පැන් කාණ්ඩ සඳහා සුරා බදු ඉහළ නැංවීම හේතුවෙන් මත්පැන් මගින් ලද සුරා බදු ආදායම 2018 වසරේ පැවති රු. බිලියන 113.9 සිට 2019 වසරේ දී රු. බිලියන 115.4 දක්වා සියයට 1.4 කින් සුළු වශයෙන් වැඩි විය. 2019 වසරේ දෙසැම්බර් මස මුල දී මත්පැන් මත පනවන ලද සුරා බදු අනුපාතික ඉහළ නැංවීම මෙම සුළු වැඩිවීමට තවදුරටත් හේතු විය. මේ අතර, එකතු කළ අගය මත බද්ද අඩු කිරීමෙන් සහ ජාතිය ගොඩනැගීමේ බද්ද ඉවත් කිරීමෙන් අහිමි වූ ආදායම නැවත ලබාගැනීම සඳහා මත්පැන් සහ දුම් වැටි මත පනවන ලද නිෂ්පාදන බදු සිල්ලර මිල ගණන් වෙනස් කිරීමකින් තොරව ඉහළ නංවන ලදී.

2.2 රූප සටහන දුම්වැටි නිෂ්පාදනය සහ නිෂ්පාදන බදු ආදායම



වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බද්ද

පාස්කු ඉරුදින ප්‍රහාරයන්ට පසුව 2019 වසරේ පිළිවෙලින් ජූනි සහ සැප්තැම්බර් මාසවල සිට බලපැවැත්වෙන පරිදි සංයෝජිත වර්ගීකරණ පරිච්ඡේද 84 සහ 85 යටතේ වන ආරක්ෂිත උපකරණ මත වූ වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු අනුපාතික අඩුකිරීම හේතුවෙන් ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස මෙන්ම නාමික වශයෙන් යන දෙඅංශයෙන්ම වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු ආදායම පහත වැටී ඇත. මේ අනුව, ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු ආදායම 2018 වසරේ වාර්තා වූ සියයට 0.8 සිට 2019 වසරේ දී 0.7 දක්වා ද, නාමික වශයෙන් ගත් කළ 2018 වසරේ වාර්තා වූ රු. බිලියන 113.9 සිට 2019 වසරේ දී රු. බිලියන 112.2 දක්වා සියයට 1.6 කින් ද පහත වැටී ඇත. ඩීසල්, පෙට්‍රල්, ඛනිජතෙල්, කිරිපිටි සහ එල් පී ගෑස් ආනයන මගින් ලද ආදායම වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු ආදායම සඳහා ප්‍රධාන වශයෙන් දායක වී ඇත. සමස්ත බදු ආදායම සඳහා වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු ආදායම දැක් වූ දායකත්වය 2018 වසරේ වූ සියයට 6.7 සිට 2019 වසරේ දී සියයට 6.5 දක්වා අඩු විය. 2019 වසරේ දෙසැම්බර් මස සිට බලපැවැත්වෙන පරිදි සම්මත වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු අනුපාතිකය සියයට 7.5 සිට සියයට 10.0 ක් දක්වා ඉහළ නැංවීම එම බදු ආදායම වැඩි වීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපානු ඇත.

සෙස් බද්ද

ආනයන ආශ්‍රිත ක්‍රියාකාරකම් පහත වැටීම මෙන්ම තෝරාගත් පාරිභෝගික භාණ්ඩ මත පනවන ලද සෙස් බදු වරින් වර ඉවත් කිරීමත් හේතුවෙන් සෙස් බදු ආදායම ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස මෙන්ම නාමික වශයෙන් යන දෙඅංශයෙන්ම පහත වැටී ඇත. සෙස් බදු ආදායම ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස පෙර වසරේ වාර්තා වූ සියයට 0.4 සිට මෙම වසරේ සියයට 0.3 දක්වා අඩු විය. සෙස් බදු ආදායම 2018 වසරේ වූ රු. බිලියන 53.4 සිට 2019 වසරේ දී රු. බිලියන 50.7 ක් දක්වා සියයට 5.0 කින් පහත වැටී ඇත. ආනයන මත සෙස් බදු ආදායම 2018 වසරේ වාර්තා වූ රු. බිලියන 50.8 සිට 2019 වසරේ දී රු. බිලියන 48.4 දක්වා සියයට 4.7 කින් අඩු විය. 2019 අයවැයෙන් ප්‍රකාශයට පත් කළ පරිදි, 2019 වසරේ මාර්තු මස සිට ක්‍රියාත්මක වූ බීඩිකොළ සඳහා වූ සෙස් බදු අනුපාතිකය කිලෝග්‍රෑමයකට රු. 2,500 සිට රු. 3,500 දක්වා ඉහළ දැමීම හේතුවෙන් 2019 වසරේ දී සෙස් බදු ආදායම සඳහා ඉහළම දායකත්වයක් බීඩිකොළ ආනයන ආදායම මගින් ලබා දී ඇත. මේ අනුව, සෙස් බදු ආදායමින් පහෙන් එකකට ආසන්න ප්‍රමාණයක් බීඩිකොළ මත වන සෙස් බද්දෙන් උපයාගෙන ඇත. සෙරමික් ටයිල්, සිමෙන්ති, රෙදිපිළි සහ ලිහිසි තෙල් යන නිෂ්පාදනයන් මගින් ලද ආදායම සෙස් බදු ආදායම සඳහා ප්‍රධාන වශයෙන් දායක වී ඇත. අපනයන මත සෙස් බදු ආදායම 2018 වසරේ වාර්තා වූ රු. බිලියන 2.6 සිට 2019 වසරේ දී රු. බිලියන 2.3 දක්වා සියයට 11.3 කින් පහත වැටී ඇත.

විදුලි සංදේශ බදු

විදුලි සංදේශ බදු ආදායම 2018 වසරේ වාර්තා වූ රු. බිලියන 28.3 සිට 2019 වසරේ දී රු. බිලියන 18.3 දක්වා සියයට 35.5 කින් කැපීපෙනෙන ලෙස පහත වැටී ඇත. මේ සඳහා අන්තර්ජාල සේවා සඳහා අයකරන ලද විදුලි සංදේශ බදු ඉවත් කිරීම මෙන්ම දුරකථන ඇමතුම් සේවා සඳහා අයකරනු ලබන විදුලි සංදේශ බදු අනුපාතික අඩු කිරීම ද ප්‍රධාන වශයෙන් හේතු විය. දුරකථන ඇමතුම් සේවා සඳහා පනවන ලද විදුලි සංදේශ බද්ද 2018 වසරේ නොවැම්බර් මස දී සියයට 25 සිට සියයට 15 දක්වා ද, 2019 වසරේ දෙසැම්බර් මාස දී එම අනුපාතිකය සියයට 11.25 දක්වා තවදුරටත් අඩු කරන ලදී. බදු අනුපාතික අඛණ්ඩව ඉවත් කිරීම සහ අඛණ්ඩව බදු අනුපාතික අඩු කිරීමේ සමුච්චිත බලපෑමක් ලෙස විදුලි සංදේශ බදු ආදායම අඩු විය.

2.1.2 බදු නොවන ආදායම

ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස මෙන්ම නාමික වශයෙන් යන දෙඅංශයෙන්ම බදු නොවන ආදායම සැලකිය යුතු ලෙස පහත වැටුණි. ශ්‍රී ලංකා මහ බැංකුවේ ලාභ පැවරුම් නොමැති වීම, රජය සතු වාණිජ ව්‍යවසායයන් හි ලාභ පැවරුම් අඩු වීම, ගාස්තු හා අයකිරීම් ආදායම් අඩු වීම මෙන්ම කුලී ආදායම් අඩු වීම ද මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. බදු නොවන ආදායම ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස 2018 වසරේ වූ සියයට 1.4 සිට 2019 වසරේ දී සියයට 1.0 දක්වා අඩු විය. නාමික වශයෙන් ගත් කළ, 2018 වසරේ රු. බිලියන 207.6 ක් ලෙස වාර්තා වූ බදු නොවන ආදායම 2019 වසරේ දී රු. බිලියන 156.0 දක්වා සියයට 24.9 කින් සැලකිය යුතු මට්ටමකින් අවප්‍රමාණය වී ඇත. පසුගිය වසරේ දී සමස්ත ආදායමේ ප්‍රතිශතයක් ලෙස බදු නොවන ආදායම සියයට 10.8 සිට සියයට 8.2 දක්වා අඩු වී ඇත.

ප්‍රමුඛ පෙළේ රජය සතු වාණිජ ව්‍යවසායයන්හි දුර්වල මූල්‍ය කළමනාකරණය හේතුවෙන් 2018 වසරේ රු. බිලියන 41.8 ක් වූ ලාභ හා ලාභාංශ පැවරුම් 2019 වසරේ දී රු. බිලියන 27.8 දක්වා සියයට 33.4 කින් අඩු වී ඇත. 2019 අයවැයට සමගාමීව ගාස්තු හා අයකිරීම් අනුපාතික ඉහළ දැමුව ද, මන්දගාමී ආර්ථික කටයුතු මෙන්ම පාස්කු ඉරුදින ප්‍රහාර හමුවේ 2018 වසරේ රු. බිලියන 105.2 ක් වූ ගාස්තු හා අයකිරීම් ආදායම් 2019 වසරේ රු. බිලියන 73.9 දක්වා සියයට 29.8 කින් සැලකිය යුතු ලෙස පහත වැටී ඇත. මීට අමතරව, 2018 වසරේ රු. බිලියන 5.6 ක් වූ කුලී ආදායම 2019 වසරේ දී රු. බිලියන 4.7 දක්වා සියයට 15.4 කින් අඩු වී ඇත.

2.5 වගුව: බදු නොවන ආදායම

රු. මිලි.

අයිතමය	2014	2015	2016	2017	2018	2019	2017/2018 (ප්‍රතිශතක වෙනස)	2018 (සමස්ත බදු නොවන ආදායම ලෙස)
පොලී/කුලී	13,647	7,321	15,806	11,845	13,731	18,547	35.1	11.9
ලාභ සහ ලාභාංශ	46,814	29,798	108,160	53,998	41,828	27,857	-33.4	17.9
විකුණුම් සහ ගාස්තු	35,499	44,632	72,606	66,575	105,202	73,884	-29.8	47.4
සමාජ ආරක්ෂණ දායක මුදල්	14,919	15,213	18,046	22,940	25,214	28,985	15.0	18.6
මහ බැංකු ලාභ පැවරීම	11,500	-	5,000	-	15,000	-	-100.0	0.0
අනෙකුත්	22,466	2,135	2,754	5,995	6,681	6,701	0.3	4.3
එකතුව	**144,845**	**99,099**	**222,372**	**161,353**	**207,656**	**155,974**	**-24.9**	**100.0**

ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ක්‍රියාමාර්ග: 2019 ජනවාරි - දෙසැම්බර්

ක්‍රියාත්මක වන දිනය	ක්‍රියාමාර්ගය
එකතු කළ අගය මත බද්ද - 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත	
2019.05.21	2019.05.21 දිනැති අංක 2124/3 දරන ගැසට් නිවේදනය - ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි වී ඇති, හෝටල්, ආගන්තුක නිවාස, ආපන ශාලා හෝ සමාන සේවා සපයන ඒ හා සමාන අනෙකුත් ආයතන විසින් සහ රට තුළට එන සංචාර හා සම්බන්ධව සංචාරක නියෝජිතයින් විසින් සේවා සැපයුම මත අදාල වන එකතු කළ අගය මත බදු අනුපාතිකය සියයට 15 සිට සියයට 5 දක්වා අඩු කිරීමට.
2019.06.01	2019.05.31 දිනැති අංක 2125/69 දරන ගැසට් නිවේදනය - ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි වී ඇති, හෝටල්, ආගන්තුක නිවාස, ආපන ශාලා හෝ සමාන සේවා සපයන අනෙකුත් ඒ හා සමාන ආයතන විසින් සහ රට තුළට එන සංචාර හා සම්බන්ධව සංචාරක නියෝජිතයින් විසින් සේවා සැපයුම මත අදාල වන එකතු කළ අගය මත බදු අනුපාතිකය සියයට 5 සිට සියයට 7 දක්වා වැඩි කිරීමට.

2019.11.01	2019 අංක 19 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත - ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ගිවිසුම්ගත, අපනයනය පදනම් කරගත් ආයතන විසින් ඇතැම් ඇඟළුම් දේශීයව විකිණීමේ දී ඒකක මත පදනම් කරගත් එකතු කළ අගය මත බදු අනුපාතිකය රු. 75 සිට රු.100 දක්වා වැඩි කිරීමට. - දේශීයව නිෂ්පාදිත සහල්වලින් දේශීයව නිෂ්පාදිත සහල් නිවුඩු තෙල් එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කිරීමට. - යම් ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් ඔවුන් විසින්, ශ්‍රී ලංකාවෙන් පිටත දී කරගෙන යනු ලබන ඉදිකිරීම් ව්‍යාපෘතියක් සඳහා භාවිත කිරීම පිණිස භාණ්ඩ සැපයීම අපනයන ලෙස සැලකීම. - සහාධිපත්‍ය නිවාස ඒකක විකිණීමේදී අයවන එකතු කළ අගය මත බද්ද සියයට 6 දක්වා අඩු කිරීම සහ එම සැපයුමට අදාල යෙදවුම් බද්ද සියයට 5 අනුපාතිකයට ගණනය කිරීමට. - සහාධිපත්‍ය නිවාස ඒකක විකිණීමේදී අදාල වූ එකතු කළ අගය මත බදු නිදහස ඉවත් කිරීමට.

2019.12.01	2019.11.29 දිනැති අංක 2151/52 දරන ගැසට් නිවේදනය
	- 2019.12.01 දින සිට බලාත්මක එකතු කළ අගය මත බදු අනුපාතිකය පහත සඳහන් පරිදි දක්වා ඇත;
	    - මුළු යෙදවුම් වටිනාකමින් සියයට හැටක් (60%) දේශීය සැපයුම්/මූලාශ්‍ර වලින් ප්‍රභවය වන්නේ නම්, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි වී ඇති හෝටල්, ආගන්තුක නිවාස, ආපනශාලා හෝ සමාන සේවා සපයන ඒ හා සමාන අනෙකුත් ආයතන විසින් සපයන සේවා - සියයට 0
	    - රෙදිපිළි ආනයනය - සියයට 0
	    - මූල්‍ය සේවා සැපයීම - සියයට 15
	    - ඉහත දක්වා ඇති සේවා සැපයීම/භාණ්ඩ ආනයනය හැර අනෙකුත් භාණ්ඩ ආනයනය සහ/හෝ සැපයීම හෝ සේවා සැපයීම - සියයට 8

2019.12.06	2019.12.05 දිනැති අංක 2152/60 දරන ගැසට් නිවේදනය -2019.11.29 දිනැති අංක 2151/52 දරන ගැසට් නිවේදනයේ 1(අ) ඡේදය පැහැදිලි කිරීමට.
ජාතිය ගොඩනැගීමේ බද්ද (ජා.ගො.බ.) - 2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත	
2019.11.01	2019 අංක 20 දරන ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත - දුම් වැටි (සිගරැට්) නිෂ්පාදනය, ආනයනය සහ ආනයනය කර අලෙවි කිරීම මත පැවති බදු නිදහස ඉවත් කිරීමට. - ආනයනකරු ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ ලියාපදිංචි වී ඇත්නම් සහ විදේශ ව්‍යවහාර මුදලින් ගෙවීම් සිදුකර බැංකුවක් හරහා ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කරන්නේ නම් කපා, ඔපදමා ප්‍රතිඅපනයනය කිරීමේ කාර්යය සඳහා මැණික් ගල් ආනයනය කිරීම ජාතිය ගොඩනැගීමේ බද්දෙන් නිදහස් කිරීමට. - ආනයනය කරන ලද ශුද්ධ නොකළ පාම් තෙල්වලින් හෝ ආනයනය කරන ලද පාම් ඔලීන් වලින් දේශීයව නිපදවනු ලබන පාම් තෙල් ජාතිය ගොඩනැගීමේ බද්දෙන් නිදහස් කිරීමට. - ලූසන් (ඇල්ෆැල්ෆා) ආහාර සහ තැටි ආනයනය කිරීම ජාතිය ගොඩනැගීමේ බද්දෙන් නිදහස් කිරීමට. - විනෝදය සඳහා හෝ ක්‍රීඩා සඳහා වූ යොට් යාත්‍රා සහ වෙනත් යාත්‍රා, කුඩා හබල් ඔරු සහ කැන්වස් ආනයනය කිරීම ජාතිය ගොඩනැගීමේ බද්දෙන් නිදහස් කිරීමට. - ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ගිවිසුමකට ඇතුළත්වූ ඇමරිකානු ඩොලර් මිලියන පනහකට නොඅඩු ප්‍රාග්ධන ආයෝජනයන් සහිත වූ යම් ව්‍යවසායයක් විසින්, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන කාලසීමාව තුළ සහ වාණිජ කටයුතු ආරම්භ කිරීම පෙර, ව්‍යාපෘතියට අදාළ වූ යම් භාණ්ඩයක් ආනයනය කිරීම ජාතිය ගොඩනැගීමේ බද්දෙන් නිදහස් කිරීමට. - ගොඩනැගිලි, පාරවල්, පාලම්, ජල සැපයුම, ජලය හෝ මලාපවාහන පද්ධති, වරාය, ගුවන් තොටුපල ඉදිකිරීම් හෝ විදුලි සංදේශ හෝ විදුලි බලය පිළිබඳ යටිතල පහසුකම් ව්‍යාපෘතියක් සම්බන්ධ ඉදිකිරීම් වනතාක් දුරට ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවකු හෝ උප කොන්ත්‍රාත්කරුවකු සලසනු ලබන සේවා ජාතිය ගොඩනැගීමේ බද්දෙන් නිදහස් කිරීමට. - ලංකා සංචාරක මණ්ඩලය වෙත ලියාපදිංචි යම් හෝටලයක්, අමුත්තන්ගේ නිවාසයක්, ආපන ශාලාවක් හෝ ඒ හා සමාන වෙනත් ව්‍යාපාරයක් විසින් විදේශ ව්‍යවහාර මුදලින් කරන ඉපයීම් ජාතිය ගොඩනැගීමේ බද්දෙන් නිදහස් කිරීමට.
2019.12.01	- ජාතිය ගොඩනැගීමේ බද්ද ඉවත් කිරීමට.
නිෂ්පාදන (විශේෂ විධි විධාන) බද්ද - 1989 අංක 13 දරන නිෂ්පාදන (විශේෂ විධි විධාන) පනත	
2019.01.11	2019.01.11 දිනැති අංක 2105/48 දරන ගැසට් නිවේදනය

<table>
<tr><td></td><td>- රාජ්‍ය සේවයේ බලපත්‍ර ක්‍රමය යටතේ සහ 2018 ජූනි 08 දිනට පෙර ස්ථාපිත ණයවර ලිපියක් යටතේ ආනයනය කළ මෝටර් රථ රේගුවෙන් නිදහස් කරගැනීමට ලබාදුන් කාලය දීර්ඝ කිරීමට.</td></tr>
<tr><td>2019.03.06</td><td>2019.03.05 දිනැති අංක 2113/09 දරන ගැසට් නිවේදනය

- දුම් වැටි මත නිෂ්පාදන බද්ද පහත සඳහන් පරිදි වැඩි කිරීමට:

<table>
<tr><th>වර්ගය</th><th>පැවති බද්ද
(දුම් වැටි 1,000 ට රු.)</th><th>සංශෝධිත බද්ද
(දුම් වැටි 1,000 ට රු.)</th></tr>
<tr><td>මි.මි. < 60</td><td>11,675</td><td>-</td></tr>
<tr><td>මි.මි. 60 - 67</td><td>17,375</td><td>19,500</td></tr>
<tr><td>මි.මි. 67 - 72</td><td>20,500</td><td>23,000</td></tr>
<tr><td>මි.මි. 72 - 84</td><td>33,550</td><td>37,580</td></tr>
<tr><td>මි.මි. > 84</td><td>37,675</td><td>42,200</td></tr>
</table>

- තෝරාගත් භාණ්ඩ මත නිෂ්පාදන බද්ද පහත සඳහන් පරිදි වැඩි කිරීමට:

<table>
<tr><th>භාණ්ඩය</th><th>පැවති බද්ද</th><th>සංශෝධිත බද්ද</th></tr>
<tr><td>පැණිරස කාරක පාන වර්ග</td><td>බදු නිදහස් ප්‍රමාණය ඉක්මවන සීනි ග්‍රෑම් 01 කට ශත 30 හෝ ලීටරයට රු. 12</td><td>බදු නිදහස් ප්‍රමාණය ඉක්මවන සීනි ග්‍රෑම් 01 කට ශත 40 හෝ ලීටරයට රු. 12</td></tr>
<tr><td>පාම් තෙල් මේද අම්ල</td><td>25%</td><td>20%</td></tr>
<tr><td>ටැලෝ මේද අම්ල</td><td>25%</td><td>20%</td></tr>
<tr><td>ශීතකරණ</td><td>17%</td><td>25%</td></tr>
<tr><td>එන්ජිම සහ කුටි සවිකළ වැසි ලෙස ආනයනය කරනු ලබන වාහන</td><td>ඒකකයකට රු.700,000</td><td>ඒකකයකට රු. 500,000</td></tr>
</table>

- එන්ජින් ධාරිතාව ඝණ සෙන්ටිමීටර 2,000 ට අඩු මෝටර් රථ වල නිෂ්පාදන බද්ද වැඩි කිරීමට.
- අවමංගල රථ, හයිබ්‍රිඩ් සහ ඉලෙක්ට්‍රික් වෑන් සහ සින්ගල් කැබ් මත නිෂ්පාදන බද්ද අඩු කිරීමට.
- කි.ග්‍රෑ. 2000 ට නොවැඩි භාණ්ඩ ප්‍රවාහන ධාරිතාවයක් සහිත කුඩා ලොරි රථවල නිෂ්පාදන බද්ද අඩු කිරීමට.</td></tr>
<tr><td>2019.03.13</td><td>2019.03.13 දිනැති අංක 2114/25 දරන ගැසට් නිවේදනය
- අංක 2113/9 දරන 2019.03.05 දිනැති ගැසට් නිවේදනයේ අතීතයට බලපෑම ඉවත් කිරීමට.</td></tr>
<tr><td>2019.03.15</td><td>2019.03.14 දිනැති අංක 2114/49 දරන ගැසට් නිවේදනය
- ඉලෙක්ට්‍රික් වාහන මත නිෂ්පාදන බද්ද අඩු කිරීමට.</td></tr>
<tr><td>2019.04.05</td><td>2019.04.04 දිනැති අංක 2117/48 දරන ගැසට් නිවේදනය
- 2015 – 2017 කාලය තුළ සිදුකළ මෝටර් වාහන මත නිෂ්පාදන බදු සංශෝධන හේතුවෙන් හම්බන්තොට වරායේ රඳවා ඇති මෝටර් වාහන නිදහස් කරගැනීමට නිෂ්පාදන බදු සහන ලබාදීමට.</td></tr>
<tr><td>2019.05.14</td><td>2019.05.13 දිනැති අංක 2123/5 දරන ගැසට් නිවේදනය</td></tr>
</table>

<table>
<tr><td></td><td>- දිගින් මි.මි. 72 ට වැඩි නමුත් මි.මි. 84 ට නොවැඩි දුම් වැටි මත අදාල වන නිෂ්පාදන බද්ද දුම් වැටි 1,000 ට රු. 36,580 සිට දුම් වැටි 1,000 ට රු. 37,600 දක්වා වැඩි කිරීමට.</td></tr>
<tr><td>2019.07.11</td><td>2019.07.10 දිනැති අංක 2131/29 දරන ගැසට් නිවේදනය
- දිගින් මි.මි. 67 ට වැඩි නමුත් මි.මි. 72 ට නොවැඩි දුම් වැටි මත අදාල වන නිෂ්පාදන බද්ද දුම් වැටි 1,000 ට රු. 23,000 සිට දුම් වැටි 1,000 ට රු. 37,600 දක්වා වැඩි කිරීමට.</td></tr>
<tr><td>2019.08.09</td><td>2019.08.08 දිනැති අංක 2135/55 දරන ගැසට් නිවේදනය
- අංක 2117/48 දරන 2019.04.04 දිනැති ගැසට් නිවේදනය යටතේ බදු පනවා අයකෙරෙන වාහන රේගුවෙන් නිදහස් කරගැනීමට ලබා දී තිබූ කාල සීමාව දීර්ඝ කිරීමට.</td></tr>
<tr><td>2019.10.15</td><td>2019.10.14 දිනැති අංක 2145/12 දරන ගැසට් නිවේදනය
- දිගින් මි.මි. 67 ට වැඩි නමුත් මි.මි. 72 ට නොවැඩි දුම් වැටි මත අදාල වන නිෂ්පාදන බද්ද දුම් වැටි 1,000 ට රු. 37,600 සිට දුම් වැටි 1,000 ට රු. 33,000 දක්වා අඩු කිරීමට.</td></tr>
<tr><td>2019.12.01</td><td>2019.12.01 දිනැති අංක 2151/60 දරන ගැසට් නිවේදනය
දුම් වැටි මත නිෂ්පාදන බද්ද පහත සඳහන් පරිදි වැඩි කිරීමට:
<table>
<tr><th>වර්ගය</th><th>පැවති බද්ද
(දුම් වැටි 1,000 ට රු.)</th><th>සංශෝධිත බද්ද
(දුම් වැටි 1,000 ට රු.)</th></tr>
<tr><td>මි.මි. < 60</td><td>11,675</td><td>13,360</td></tr>
<tr><td>මි.මි. 60 - 67</td><td>19,500</td><td>22,300</td></tr>
<tr><td>මි.මි. 67 - 72</td><td>33,000</td><td>37,650</td></tr>
<tr><td>මි.මි. 72 - 84</td><td>37,600</td><td>43,100</td></tr>
<tr><td>මි.මි. > 84</td><td>42,200</td><td>48,350</td></tr>
</table></td></tr>
<tr><td colspan="2">සුරාබදු ආඥා පනත (52 වන අධිකාරය)</td></tr>
<tr><td>2019.03.06</td><td>සුරාබදු නිවේදන අංක 01/2019 (2019.03.05 දිනැති අංක 2113/6 දරන ගැසට් නිවේදනය)
- දේශීයව නිෂ්පාදනය කරන මත්පැන් මත අයවන සුරා බද්ද පහත සඳහන් පරිදි වැඩි කිරීමට:
<table>
<tr><th>වර්ගය</th><th>පැවති බද්ද
(ලීටරයට රු.)</th><th>සංශෝධිත බද්ද
(ලීටරයට රු.)</th></tr>
<tr><td>විශේෂ අරක්කු</td><td>3,300</td><td>-</td></tr>
<tr><td>අනෙකුත් අරක්කු</td><td>3,300</td><td>3,550</td></tr>
<tr><td>මෙරට නිෂ්පාදිත විදේශ අරක්කු</td><td>3,300</td><td>3,550</td></tr>
<tr><td>බියර් (මධ්‍යසාර ප්‍රතිශතය 5%ට අඩු)</td><td>2,400</td><td>2,700</td></tr>
<tr><td>බියර් (මධ්‍යසාර ප්‍රතිශතය 5%ට වැඩි)</td><td>2,400</td><td>2,700</td></tr>
<tr><td>දේශීය වයින්</td><td>100</td><td>600</td></tr>
</table></td></tr>
<tr><td>2019.03.06</td><td>සුරාබදු නිවේදන අංක 02/2019 (2019.03.05 දිනැති අංක 2113/7 දරන ගැසට් නිවේදනය)
- ආනයනික විදේශීය මත්පැන් මත අයවන සුරා බද්ද පහත සඳහන් පරිදි සංශෝධනය කිරීමට:</td></tr>
</table>

<table>
<tr><td></td><td>
<table>
<tr><th>වර්ගය</th><th>පැවති බද්ද
(තොග ලීටරයට රු.)</th><th>සංශෝධිත බද්ද
(තොග ලීටරයට රු.)</th></tr>
<tr><td>මෝල්ට් අරක්කු (බියර්)</td><td>50</td><td>55</td></tr>
<tr><td>වයින්</td><td>100</td><td>110</td></tr>
<tr><td>අනෙකුත් අරක්කු</td><td>200</td><td>215</td></tr>
</table>
</td></tr>
<tr><td>2019.03.06</td><td>සුරාබදු නිවේදන අංක 03/2019 (2019.03.05 දිනැති අංක 2113/8 දරන ගැසට් නිවේදනය) - දේශීය අමුද්‍රව්‍ය වලින් නිෂ්පාදනය කරන දේශීය වයින් (සකේ ද ඇතුළුව) මත අයවන සුරා බද්ද වැඩි කිරීමට.</td></tr>
<tr><td>2019.06.20</td><td>සුරාබදු නිවේදන අංක 04/2019 (2019.06.20 දිනැති අංක 2128/30 දරන ගැසට් නිවේදනය)
- ආරක්ෂිත මුද්‍රාපටි සහ මුද්‍රාපටි කළමණාකරණ ක්‍රමවේදය හඳුන්වා දීමට.</td></tr>
<tr><td>2019.09.27</td><td>සුරාබදු නිවේදන අංක 05/2019 (2019.09.27 දිනැති අංක 2142/77 දරන ගැසට් නිවේදනය)
- විදේශීය මත්පැන් සිල්ලර අළෙවිය සීමා කිරීම සහ බලපත්‍රයක් රහිතව සද්භාවයෙන් යුතුව පුද්ගලික පරිහරණය සඳහා සන්තකයේ තබාගත හැකි සහ ප්‍රවාහනය කළහැකි උපරිම ප්‍රමාණය දැක්වීමට.</td></tr>
<tr><td>2019.11.01</td><td>සුරාබදු නිවේදන අංක 06/2019 (2019.11.01 දිනැති අංක 2147/75 දරන ගැසට් නිවේදනය)
- සුරාබදු නිවේදන අංක 04/2019 හි දැක්වෙන රීති සංශෝධනය කිරීමට.</td></tr>
<tr><td>2019.12.03</td><td>සුරාබදු නිවේදන අංක 07/2019 (2019.12.03 දිනැති අංක 2152/11 දරන ගැසට් නිවේදනය)
- දේශීයව නිෂ්පාදනය කරන මත්පැන් මත අයවන සුරා බද්ද පහත සඳහන් පරිදි සංශෝධනය කිරීමට:
<table>
<tr><th>වර්ගය</th><th>පැවති බද්ද
(ලීටරයට රු.)</th><th>සංශෝධිත බද්ද
(ලීටරයට රු.)</th></tr>
<tr><td>විශේෂ අරක්කු</td><td>3,300</td><td>3,800</td></tr>
<tr><td>අනෙකුත් අරක්කු</td><td>3,550</td><td>4,050</td></tr>
<tr><td>මෙරට නිෂ්පාදිත විදේශ අරක්කු</td><td>3,550</td><td>4,150</td></tr>
<tr><td>බියර් (මධ්‍යසාර ප්‍රතිශතය 5%ට අඩු)</td><td>2,700</td><td>3,200</td></tr>
<tr><td>බියර් (මධ්‍යසාර ප්‍රතිශතය 5%ට වැඩි)</td><td>2,700</td><td>3,200</td></tr>
<tr><td>දේශීය වයින්</td><td>600</td><td>900</td></tr>
</table>
</td></tr>
<tr><td>2019.12.03</td><td>සුරාබදු නිවේදන අංක 08/2019 (2019.12.03 දිනැති අංක 2152/12 දරන ගැසට් නිවේදනය)
- ආනයනික විදේශීය මත්පැන් මත අයවන සුරා බද්ද පහත සඳහන් පරිදි සංශෝධනය කිරීමට:
<table>
<tr><th>වර්ගය</th><th>පැවති බද්ද
(තොග ලීටරයට රු.)</th><th>සංශෝධිත බද්ද
(තොග ලීටරයට රු.)</th></tr>
<tr><td>මෝල්ට් අරක්කු (බියර්)</td><td>55</td><td>135</td></tr>
<tr><td>වයින්</td><td>110</td><td>230</td></tr>
<tr><td>අනෙකුත් අරක්කු</td><td>215</td><td>650</td></tr>
</table>
</td></tr>
<tr><td>2019.12.03</td><td>සුරාබදු නිවේදන අංක 09/2019 (2019.12.03 දිනැති අංක 2152/13 දරන ගැසට් නිවේදනය)
- දේශීයව නිෂ්පාදනය කරන වයින් මත අයවන සුරා බද්ද සංශෝධනය වැඩි කිරීමට.</td></tr>
<tr><td>2019.12.27</td><td>සුරාබදු නිවේදන අංක 10/2019 (2019.12.26 දිනැති අංක 2155/19 දරන ගැසට් නිවේදනය)</td></tr>
</table>

	- අපනයනකරුවන්ට සුරා බද්ද ගෙවීමට හෝ බැඳුම්කරයක් හෝ බැංකු ඇපකරයක් ඉදිරිපත්කර බදු නිදහස් පදනම යටතේ අපනයනය නිරීමට ඉඩදීමට.
වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු - 2011 අංක 18 දරන වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු පනත	
2019.03.06	2019.03.05 දිනැති අංක 2013/10 දරන ගැසට් නිවේදනය - තෝරාගත් භාණ්ඩ ආනයනය මත බදු නිදහස් කිරීම සහ සහනදායී අනුපාතිකය ප්‍රදානය කිරීමට. - විනෝදාස්වාදය සඳහා භාවිතා කරන යාත්‍රා සහ නැව් නිෂ්පාදනය කරනු ලබන ආයෝජන මණ්ඩලය සමග ගිවිසුම්ගත ආයතන විසින් සිය ව්‍යාපාරය ලෙස මෙම යාත්‍රා හා නැව් කුලියට දෙනු ලබන ආයෝජන මණ්ඩලය සමග ගිවිසුම්ගත ව්‍යාපාර වෙත විකිණීමේදී වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බද්දෙන් නිදහස් කිරීම.
2019.05.07	2019.05.07 දිනැති අංක 2122/16 දරන ගැසට් නිවේදනය - ආරක්ෂක මෙවලම් ආනයනය කිරීම මත බදු නිදහස් කිරීම ප්‍රදානය කිරීමට.
2019.06.01	2019.05.31 දිනැති අංක 2125/64 දරන ගැසට් නිවේදනය - සංයෝජිත වර්ගීකරණ පරිච්ඡේද අංක 85 යටතේ දක්වා ඇති තෝරාගත් භාණ්ඩ සඳහා සහනදායී අනුපාතිකය ප්‍රදානය කිරීමට.
2019.09.25	2019.09.24 දිනැති අංක 2142/07 දරන ගැසට් නිවේදනය - තෝරාගත් භාණ්ඩ සඳහා සහනදායී අනුපාතිකය ප්‍රදානය කිරීමට. - ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ගිවිසුමකට ඇතුළත්වූ ඇමරිකානු ඩොලර් මිලියන පනහකට නොඅඩු ප්‍රාග්ධන ආයෝජනයන් සහිත වූ යම් ව්‍යවසායයක් විසින්, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන කාලසීමාව තුළ සහ වාණිජ කටයුතු ආරම්භ කිරීම පෙර, ව්‍යාපෘතියට අදළ වූ යම් භාණ්ඩයක් ආනයනය කිරීම වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බද්දෙන් නිදහස් කිරීමට. - දේශගුනික තත්ත්වයන් පාලනය කෙරෙන ගබඩා පහසුකම්/ශීත දාම සැපයුම් යටිතල පහසුකම් ස්ථාපිත කිරීමේ ව්‍යාපෘති සඳහා ආයෝජනය කරනු ලබන ඕනෑම ව්‍යවසායයක් මගින්, ව්‍යාපෘතිය ආරම්භ කරන තෙක් හෝ ඉදිකිරීම් සිදු කරන කාලසීමාව තුළ නමුත් වාණිජ ක්‍රියාකාරකම් ආරම්භ කිරීමට පෙර භාණ්ඩ ආනයනය කිරීම වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බද්දෙන් නිදහස් කිරීමට.
2019.12.06	2019.12.05 දිනැති අංක 2152/32 දරන ගැසට් නිවේදනය - වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු සම්මත අනුපාතිකය සියයට 10 සහ සියයට 2.5, සියයට 5 සහ සියයට 7.5 යන ස්ථර තුනකින් යුතු සහනදායී අනුපාතිකය ප්‍රකාශයට පත් කිරීමට.
සෙස් බද්ද - 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත	
2019.03.06	2019.03.05 දිනැති අංක 2113/3 දරන ගැසට් නිවේදනය - තෝරාගත් භාණ්ඩ ආනයනය මත සෙස් බදු ඉවත් කිරීමට.
2019.03.06	2019.03.05 දිනැති අංක 2113/04 දරන ගැසට් නිවේදනය - ජෛවභායනයට ලක්වන ප්ලාස්ටික් ඇතුළුව මෝටර් රථ අමතර කොටස්, බීඩි කොළ යනාදිය ආනයනය කිරීම මත සෙස් බද්ද හඳුන්වා දීම සහ/හෝ සංශෝධනය කිරීමට.
2019.04.04	2019.04.04 දිනැති අංක 2117/46 දරන ගැසට් නිවේදනය - අංක 2113/4 දරන 2019.03.05 දිනැති ගැසට් නිවේදනයේ මගින් නිකුත් කළ නියෝගයේ අතීතයට බලපෑම ඉවත් කිරීමට.
2019.10.03	2019.10.02 දිනැති අංක 2143/17 දරන ගැසට් නිවේදනය - ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි කර ඇති හා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ගිවිසුමකට එළඹ තිබෙන ඕනෑම සංචාරක ව්‍යවසායයක් විසින් ආනයනය කරන ලද සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ 94.03 යටතේ වර්ගීකරණය කරන ලද ගෘහ භාණ්ඩ, - ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ගිවිසුමකට එළඹ තිබෙන ඇ. ඩොලර් මිලියන 50 හෝ ඊට වැඩි ව්‍යාපෘතියක ආයෝජනයක් සිදුකරන ඕනෑම ව්‍යවසායයක් මගින්, එකී ව්‍යාපෘතිය ආරම්භ කරන තෙක් හෝ ව්‍යාපෘතිය ඉදිකිරීම් සිදු කරන කාලසීමාව තුළ නමුත් වාණිජ ක්‍රියාකාරකම් ආරම්භ කිරීමට පෙර, ආනයනය කරනු ලබන භාණ්ඩ, - දේශගුනික තත්ත්වයන් පාලනය කෙරෙන ගබඩා පහසුකම්/ශීත දාම සැපයුම් යටිතල පහසුකම් ස්ථාපිත කිරීමේ ව්‍යාපෘති සඳහා ආයෝජනය කරනු ලබන ඕනෑම ව්‍යවසායයක් මගින්, ව්‍යාපෘතිය ආරම්භ කරන තෙක් හෝ ඉදිකිරීම් සිදු කරන කාලසීමාව තුළ නමුත් වාණිජ ක්‍රියාකාරකම් ආරම්භ කිරීමට පෙර ආනයනය කරනු ලබන භාණ්ඩ,සෙස් බද්දෙන් නිදහස් කිරීමට.

2018 අංක 35 දරන මුදල් පනත

කාබන් බද්ද

දිනය	විස්තරය
2019.01.01	- මෝටර් වාහන මත පහත සඳහන් පරිදි කාබන් බද්ද පැනවීමට:

වාහනයේ කාණ්ඩය	වාහනය ලියාපදිංචියේ සිට ගතවූ කාලය/ අනුප්‍රමාණය		
	වසර 5 ට අඩු	වසර 5 සිට 10 දක්වා	වසර 10 වැඩි
දෙමුහුන් (පෙට්‍රල්/ ඩීසල්)	ඝන සෙ.මී. ට ශත 25	ඝන සෙ.මී.ට ශත 50	ඝන සෙ.මී.ට රු.1
ඉන්ධන (පෙට්‍රල්/ඩීසල්)	ඝන සෙ.මී.ට ශත 50	ඝන සෙ.මී.ට රු.1	ඝන සෙ.මී.ට රු.1.50
මගී බස් රථ	රු. 1,000	රු. 2,000	රු. 3,000

2019.12.01	- කාබන් බද්ද ඉවත් කිරීමට.

දුරකථන සන්නිවේදන කුළුණු අය බද්ද

2019.01.01	- ජංගම දුරකථන ක්‍රියාකරුවන් මත එක් එක් දුරකථන සන්නිවේදන කුළුණක් සඳහා වර්ෂයකට රු. 200,000 අනුප්‍රමාණයට දුරකථන සන්නිවේදන කුළුණු අය බද්ද පැනවීමට.

ජංගම දුරකථන කෙටි පණිවුඩ සේවා මත අය බද්ද පැනවීම

2019.01.01	- ජංගම දුරකථන කෙටි පණිවුඩ සේවා හරහා විශාල සංඛ්‍යාවකින් යවනු ලබන ප්‍රචාරක දැන්වීම් මත, එක් එක් ජංගම දුරකථන කෙටි පණිවිඩයකට ශත 25 ක අය බද්දක් පැනවීමට.

මෝටර් වාහන මත සුඛෝපභෝගී බද්ද පැනවීම කි.වොට්

2019.03.06	2019.03.05 දිනැති අංක 2113/11 දරන ගැසට් නිවේදනය - පහත සඳහන් පරිදි මෝටර් වාහන මත සුඛෝපභෝගී බද්ද පැනවීමට:

වාහන වර්ගය	එංජින් ධාරිතාව	සුඛෝපභෝගී බදු නිදහස් සීමාව	අනුපාතිකය (අ)
ඩීසල්	x > **ඝන සෙ.මී** 2,300	රු. මිලියන 3.5	120%
පෙට්‍රල්	x > **ඝන සෙ.මී** 1,800	රු. මිලියන 3.5	100%
දෙමුහුන් ඩීසල්	x > **ඝන සෙ.මී** 2,300	රු. මිලියන 4.0	90%
දෙමුහුන් පෙට්‍රල්	x > **ඝන සෙ.මී** 1,800	රු. මිලියන 4.0	80%
ඉලෙක්ට්‍රික්	x > **කි.වොට්** 200	රු. මිලියන 6.0	60%

(අ) සුඛෝපභෝගී බදු නිදහස් සීමාව ඉක්මවන ප්‍රමාණය සහ එංජින් ධාරිතාව මත අදාල වේ.

2019.03.07	2019.03.07 දිනැති අංක 2113/46 දරන ගැසට් නිවේදනය - 2019.03.05 දිනැති අංක 2113/11 දරන ගැසට් නිවේදනය සංශෝධනය කිරීමට.
2019.04.09	2019.04.09 දිනැති අංක 2118/24 දරන ගැසට් නිවේදනය - 2019.03.05 දිනැති අංක 2113/11 දරන ගැසට් නිවේදනය සංශෝධනය කිරීමට.
2019.11.01	2019.10.31 දිනැති අංක 2147/72 දරන ගැසට් නිවේදනය - මෝටර් වාහන මත සුඛෝපභෝගී බද්ද සඳහා එංජින් ධාරිතාවේ අදාලත්වය ඉවත් කිරීමට.
2019.12.14	2019.12.14 දිනැති අංක 2153/11 දරන ගැසට් නිවේදනය - 2019.10.31 දිනැති අංක 2147/72 දරන ගැසට් නිවේදනය සංශෝධනය කිරීමට.

2004 අංක 11 දරන මුදල් පනත

ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු බද්ද

2019.05.14	2019.05.14 දිනැති අංක 2123/19 දරන ගැසට් නිවේදනය - එන ජාත්‍යන්තර ඇමතුම් මත ගෙවිය යුතු බදු අනුප්‍රමාණය සහ විශේෂිත දුරකථන අංක (වි.දු.අ.) සඳහා එන ජාත්‍යන්තර ඇමතුම් මත ගෙවිය යුතු බදු අනුප්‍රමාණය සංශෝධනය කිරීමට. - එන දේශීය ප්‍රවේශ ගාස්තු (එ.දේ.ප්‍ර.ගා.) සහ විදුලි සංදේශ සංවර්ධන ගාස්තුව (වි.සං.ස.ගා.) වශයෙන් වූ බදු බෙදාහැරීමේ අනුප්‍රමාණය සංශෝධනය කිරීමට. - යන දේශීය ප්‍රවේශ ගාස්තු (ය.දේ.ප්‍ර.ගා.) මත ගෙවිය යුතු බදු අනුප්‍රමාණය සංශෝධනය කිරීමට.

2003 අංක 25 දරන මුදල් පනත

අපගමන බද්ද

2019.04.01	2019.03.29 දිනැති අංක 2116/62 දරන ගැසට් නිවේදනය - ගුවන් යානයකින් හෝ නැවකින් ශ්‍රී ලංකාවෙන් පිටවන තැනැත්තන් සඳහා එක් මගියෙකුට ඇ. එ. ජ. ඩොලර් 60 දක්වා ඇ.එ.ජ. ඩොලර් 10 කින් අපගමන බද්ද වැඩි කිරීමට.

2019.08.01	2019.07.29 දිනැති අංක 2134/5 දරන ගැසට් නිවේදනය - අපගමන බද්ද වැඩි කිරීම අවලංගු කිරීමට. - 2019.08.01 සිට 2020.01.31 අතර කාලය තුල පැවති අනුපාතිකය වන එක් මගියෙකුට ඇඑජ ඩොලර් 50 ක් අය කිරීමට. - එක් මගියෙකුට ඇඑජ ඩොලර් 50 දක්වා වන වැඩිකළ අනුපාතිකය 2020.02.01 සිට අය කිරීමට.

අභියෝග

1. අහිතකර පශ්චාත් කෝවිඩ් 19 වසංගත ගෝලීය ආර්ථික ඉදිරි දැක්ම මධ්‍යයේ ආර්ථික වර්ධනය පවත්වා ගැනීම සඳහා ඵලදායි මූල්‍ය ප්‍රතිපත්ති සම්පාදනය කිරීම.

2. ඉහළ යන රජයේ ණය මට්ටම කළමනාකරණය කල හැකි මට්ටමක පවත්වා ගැනීම.

3. දළ දේශිය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස පහත වැටෙමින් පවතින රාජ්‍ය ආදායම ඉහල නැංවීම සඳහා ප්‍රධාන ආදායම් එකතු කිරීමේ ආයතන වල ආයතනික ප්‍රතිසංස්කරණ හදුන්වා දීම හා මූල්‍ය ප්‍රතිපත්ති හදුන්වා දීම.

එම්.කේ.සී. සේනානායක
අධ්‍යක්ෂ ජනරාල්

3.0 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ -එෆ්

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ කාල සීමාව සඳහා වන

මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

රු.

අයවැය (වර්තමාන වර්ෂය)		සටහන	තත්‍ය වර්තමාන වර්ෂය	තත්‍ය ඉකුත් වර්ෂය	
-	**ආදායම් ලැබීම්**		-	15,000,000,000	
-	ආදාම් බදු	1	-	-	ඒසීඒ -1
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒසීඒ -1
-	අන්තර්ජාතික වෙළඳාම මත බදු	3	-	-	ඒසීඒ -1
15,000,000,000	බදු නොවන ආදායම් සහ වෙනත්	4	-	15,000,000,000	
15,000,000,000	මුළු ආදයම් ලැබීම් (අ)		-	**15,000,000,000**	

-	**ආදයම් නොවන ලැබීම්**		**-**	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		60,010,000	61,410,000	**ඒසීඒ -3**
-	තැන්පතු		443,346	583,998	**ඒසීඒ -4**
-	අත්තිකාරම් ගිණුම්		4,397,505	4,279,743	**ඒසීඒ - 5/5(අ)**
-	වෙනත් ලැබීම්		2,185,354	1,759,413	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**67,036,205**	**68,033,155**	
-	**මුළු ආදායම් ලැබීම් හා ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**67,036,205**	**15,068,033,155**	
	අඩු කළා: වියදම				
	පුනරාවර්තන වියදම්		**-**	-	
48,000,000	වේතන, වැටුප් සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	**5**	38,303,821	32,154,117	**ඒසීඒ - 2(II)**
1,703,320,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	**6**	24,480,218	27,463,151	
800,000	සහනාධාර, සහනාධාර ප්‍රදාන සහ මාරු කිරීම්	**7**	813,874	583,350	
-	පොළී ගෙවීම්	**8**	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	**9**	-	-	
1,752,120,000	**මුළු පුනරාවර්තන වියදම් (ඇ)**		**63,597,912**	**60,200,617**	
	මූලධන වියදම්				
-	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම	**10**	-	-	
2,000,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම	**11**	1,202,859	356,793	
-	ප්‍රාග්ධන පැවරීම්	**12**	-	-	**ඒසීඒ - 2(II)**
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	**13**	-	-	
650,000	හැකියා වර්ධනය	**14**	193,450	361,287	
-	වෙනත් මූලධන වියදම්	**15**	-	-	
2,650,000	**මුළු මූලධන වියදම් (ඉ)**		**1,396,309**	**718,079**	

	ප්‍රධාන ලෙජර් වියදම් (ඊ)	**4,196,662**	**5,453,882**	
	තැන්පතු ගෙවීම්	442,973	572,641	**ඒසීඒ -4**
	අත්තිකාරම් ගෙවීම්	3,753,689	4,881,241	**ඒසීඒ - 5/5(අ)**
	මුළු වියදම උ = (ඇ+ඉ+ඊ)	**69,190,883**	**66,372,579**	
-	**2019 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඌ = (ඇ-උ)**	**(2,154,678)**	**150,001,660,576**	

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-8

2019 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	තතා 2,019 රු.	2,018 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	33,379,278	42,948,352
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	9,218,710	9,862,527
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	-	-
මුළු වත්කම්		**42,597,988**	**52,810,878**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
ශුද්ධ වත්කම්		9,177,310	9,821,499
දේපළ පිරියත හා උපකරණ සංචිතය		33,379,278	42,948,352
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසීඒ-5(බී)		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	41,400	41,027
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	-	-
මුළු වගකීම්		**42,597,988**	**52,810,878**

පිටු අංක 05 සිට 53 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 6 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 54 සිට 61 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
නම : එස්.ආර්. ආටිගල
තනතුර : ලේකම්
දිනය : 2020.02. 28

එස්. ආර්. ආටිගල
මහා භාණ්ඩාගාරයේ ලේකම් සහ
ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ ලේ
ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාං...
මහලේකම් කාර්යාලය
කොළඹ 01

....
ගණන්දීමේ නිලධාරි
නම : එම්.කේ.සී. සේනානායක
තනතුර : අධ්‍යක්ෂ ජනරාල්
දිනය : 2020.02. 25

ආචාර්ය එම්.කේ.සී. සේනානායක
අධ්‍යක්ෂ ජනරාල්
රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01.

....
සහකාර අධ්‍යක්ෂ (මුදල්)
නම : එස්.එස්. මාතරආරච්චි
දිනය : 2020.02. 25

ශ්‍රීමාලි. එස්. මාතරආරච්චි
සහකාර අධ්‍යක්ෂ (මුදල්)
රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01.

3.3 **මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය** **ඒසීඒ-සී**

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාල වර්ෂය සඳහා වන

මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

	තත්‍ය වර්තමාන වර්ෂය රු.	 ඉකුත් වර්ෂය රු.
<u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		-
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩ මුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදයම් නොවන ලැබීම්	72,878	
වෙනත් ශීර්ෂ වෙනුවෙන් එකතුකරන ලද ආදායම්	-	
අග්‍රිම ලැබීම්	60,010,000	63,753,411
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (අ)	**60,082,878**	**63,753,411**
<u>අඩු කළා - මුදල් වැය කිරීම්:</u>		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	55,973,238	60,238,834
සහනාධාර සහ මාරු කිරීම් වියදම්	813,874	583,350
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	309,080	305,024
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	1,013	-
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**57,097,205**	**61,127,209**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**2,985,673**	**2,626,202**
<u>ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත් වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	17,925	-
උපණය අය කර ගැනීම		
අත්තිකාරම් අය කර ගැනීම	-	-
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	**17,925**	**-**
<u>අඩු කළා - මුදල් වැය කිරීම්:</u>		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම්	1,202,859	718,079
අත්තිකාරම් ගෙවීම්		
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**1,202,859**	**718,079**

ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)	**(1,184,934)**	**(718,079)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**1,800,739**	**1,908,123**
<u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
දේශීය ණය ගැනීම්	-	2,242,686
විදේශීය ණය ගැනීම්	-	
ප්‍රදානයන් ලැබීම්	-	-
තැන්පතු ලැබීම්	5,133	
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	5,133	2,242,686
<u>අඩු කළා - මුදල් වැය කිරීම්:</u>		
දේශීය ණය ආපසු ගෙවීම්	-	3,578,169
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
තැන්පතු ගෙවීම්	1,805,871	572,641
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	**1,805,871**	**4,150,810**
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	**(1,800,738)**	**1,908,124)**
මුදල්වල ශුද්ධ වෙනස් වීම් (ඔ) = (උ) -(ඒ)	**-**	**-**
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	**-**	**-**
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	**-**	**-**

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

<u>වාර්තාකිරීමේ පදනම</u>

1) <u>වාර්තාකරණ කාලපරිච්ඡේදය</u>

2019 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2) <u>මිනුම්කරණ පදනම</u>

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම්වල ඓතිහාසික පිරිවැය නැවත තක්සේරු කරන ලද වටිනාකමට වැඩිදියුණු කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3) <u>ආදායම් හඳුනාගැනීම</u>

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසළකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4) <u>දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම</u>

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5) <u>දේපළ, පිරියත හා උපකරණ සංචිතය</u>

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

6) <u>මුදල් හා මුදල් සමාන දෑ</u>

2019 දෙසැම්බර් 31 දිනට අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ.

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු. ,000

ආදයම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු. ,000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	1,754,770	1,754,770	63,597	3.62%
ප්‍රාග්ධන	2,650	2,650	1,396	52.69%

3.7 මු.රෙ. **208** ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු. ,000

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
	අදාල නොවේ					

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. ,000

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2019 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2019 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	0	0	0	0
9152	යන්ත්‍රෝපකරණ	24,679	24,679	0	100%
9153	ඉඩම්	0	0	0	0
9154	අස්පෘශ්‍ය වත්කම්	0	0	0	0
9155	ජීව විද්‍යාත්මක වත්කම්	0	0	0	0
9160	කෙරීගෙන යන වැඩ	0	0	0	0
9180	බදු දෙන ලද වත්කම්	0	0	0	0

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව **-** ඇමුණුම I

4.0 කාර්යසාධන දර්ශක

4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

නිශ්චිත දර්ශක	තත්‍ය ප්‍රතිදානය අපේක්ෂිත ප්‍රතිදානයේ ප්‍රතිශතයක් ලෙස		
	100%- 90%	**75%-89%**	**50%- 74%**
රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය සහ මධ්‍ය කාලීන රාජ්‍ය මූල්‍ය උපාය මාර්ගය සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම.	100%		
වර්තමාන මූල්‍ය ප්‍රතිපත්ති ස්ථාවරය සමාලෝචනය කර සුදුසු ගැලපීම් යෝජනා කිරීම.	100%		
2020 ආදායම් ඇස්තමේන්තු සකස් කිරීම.			2020 වර්ෂය සඳහා අයවැයක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් නොකරන ලදී.
2019 ආදායම් කාර්ය සාධනය අධීක්ෂණය කිරීම.	100%		
2020 අයවැය කථාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම.			2020 වර්ෂය සඳහා අයවැයක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් නොකරන ලදී.
2019 අයවැයේ ආදායම් යෝජනා ක්‍රියාත්මක කිරීම	100%		
අදාල නීති ප්‍රකාරව බදු සහන සහ නිදහස් කිරීම් ලබා දීම	100%		
දෙපාර්තමේන්තුවේ පරිපාලන හා මූල්‍යමය කරුණු	100%		
2003 අංක 3 දරණ රාජ්‍ය මූල්‍ය (වගකීම්) සහන යටතේ වාර්තා සකස් කොට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම.	100%		

5.0 තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු.

ඉලක්කය / අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0%-49%	**50%-74%**	**75%- 100%**

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග.

දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය රටේ සියළු තිරසාර සංවර්ධනය අරමුණු සාක්ෂාත් කර ගැනීමට දායක වේ.

6.0 මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / (අතිරික්ත)**
ජ්‍යෙෂ්ඨ	21	17	04
තෘතීයික	03	02	01
ද්විතියික	18	18	-
ප්‍රාථමික	14	12	02

6.2 **ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ කළමනාකරණය කර ගන්නා ලදී.

6.3 මානව සම්පත් සංවර්ධනය

6.3.1 දේශීය පුහුණු 2019

පුහුණු පාඨමාලාව	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය	වැඩසටහනේ ස්වභාවය	නිමැවුම/ ලබා ගත් දැනුම
තොරතුරු තාක්ෂණය සම්බන්ධ භාණ්ඩ හා සේවා සම්පාදනයේ ලංසු ඇගයීම	1	දින 02	නොමිලේ	කෙටිකාලීන	තොරතුරු තාක්ෂණ පිළිබඳ භාණ්ඩ හා සේවා මිලදී ගැනීමේදී මිල ගණන් ඇගයීම
කාර්යාලීය ඉංග්‍රීසි භාෂා භාවිතය	2	දින 03	නොමිලේ	කෙටිකාලීන	කාර්යාල කටයුතු වලදී ඉංග්‍රීසි භාෂාව භාවිතය
සේවා අවශ්‍යතාවය සඳහා ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතා සහතිකය	3	අවුරුදු 01	නොමිලේ	මධ්‍යකාලීන	රාජකාරි කටයුතු වලදී ඉංග්‍රීසි භාෂාව හැසිරවීම පිළිබඳ දැනුම
භාණ්ඩ සමීක්ෂණ, පාඩු හා ඉවත් කිරීම් මණ්ඩල පිළිබඳ වැඩමුළුව	3	දින 02	නොමිලේ	කෙටිකාලීන	භාණ්ඩ සමීක්ෂණ කටයුතු විධිමත්ව සිදු කරන ආකාරය
වෘත්තීයවේදීන් සඳහා ඉංග්‍රීසි භාෂා ඩිප්ලෝමාව	1	අවුරුදු 01	නොමිලේ	මධ්‍යකාලීන	රාජකාරි කටයුතු වලදී ඉංග්‍රීසි භාෂාවෙන් සන්නිවේදන කටයුතු සිදු කිරීමේදී වූ කටයුතු
රාජකාරී ලිපි ලිවීමේ නිපුණතාවය	1	දින 03	නොමිලේ	කෙටිකාලීන	රාජකාරි ලිපි සකස් කිරීම සම්බන්ධ දැනුම
වාර්තා ලිවීමේ නිපුණතාවය	2	දින 03	නොමිලේ	කෙටිකාලීන	වාර්තා සකස් කිරීම පිළිබඳ දැනුම
බන්ධිත ගුදම් පිළිබඳ	3	දින 01	නොමිලේ	කෙටිකාලීන	රේගු කටයුතු

පුහුණු පාඨමාලාව	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය	වැඩසටහනේ ස්වභාවය	නිමැවුම/ ලබා ගත් දැනුම
වැඩමුළුව					පිළිබඳ අවබෝධය
ලෝක බැංකුව - දැනුවත් කිරීමේ වැඩසටහන	2	දින 01	නොමිලේ	කෙටිකාලීන	ලෝක බැංකු කටයුතු පිළිබඳ අවබෝධය
කනිෂ්ඨ විධායක නිලධාරීන් සඳහා වූ ඉංග්‍රීසි භාෂා ඩිප්ලෝමාව	4	අවුරුදු 01	නොමිලේ	මධ්‍යකාලීන	ඉංග්‍රීසි භාෂාව හැසිරවීම පිළිබඳ දැනුම
පෞද්ගලික ලිපිගොනු කළමනාකරණය	1	දින 03	නොමිලේ	කෙටිකාලීන	පෞද්ගලික ලිපිගෙනු නඩත්තු කිරීම පිළිබඳ දැනුම

6.3.2 විදේශ පුහුණු

විදේශ නියෝජිතයින් / රැස්වීම් සහ පුහුණුව - 2019					
නම	**තනතුර**	**වැඩසටහන**	**රට**	**කාල සීමාව**	**කරුණ**
කේ.ඒ. විමලේන්තිරරාජා මයා	අධ්‍යක්ෂ ජනරාල්	පවතින දීර්ඝකාලීන අරමුදල් පහසුකම් පිළිබඳ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ පැවැත්වූ තාක්ෂණික රැස්වීම	ඇ.එ.ජ.	11.01.2019 - 19.01.2019	දූත සේවා
		ජාත්‍යන්තර මූල්‍ය අරමුදල/ ලෝක බැංකු වසන්ත හමුව, G - 24 නියෝජිතයන් හා අමාත්‍යවරුන්ගේ හමුව	ඇ.එ.ජ.	06.04.2019 - 16.04.2019	දූත සේවා
		ජාත්‍යන්තර මූල්‍ය අරමුදල/ ලෝක බැංකු වාර්ෂික රැස්වීම, G - 24 නියෝජිත හමුව	ඇ.එ.ජ.	14.10.2019 - 20.10.2019	දූත සේවා
ජේ.එම්.ආර්.පී. ජයසිංහ මයා	අතිරේක අධ්‍යක්ෂ ජනරාල්	ඩිජිටල් ආර්ථික හා ෆින්ටෙක්	සිංගප්පූරුව	18.02.2019 - 22.02.2019	පුහුණු
එම්.කේ.සී. සේනානායක මයා	අධ්‍යක්ෂ	සාර්ව ආර්ථික පුරෝකථනය හා විශ්ලේෂණය	ඇ.එ.ජ.	04.03.2019 - 15.03.2019	පුහුණු
ඒ. සාරංකන් මයා	අධ්‍යක්ෂ	වෙෙළඳ හා ආර්ථික සහයෝගීතාවය පිළිබඳ යුරෝපා - ශ්‍රී ලංකා ක්‍රියාකාරී කණ්ඩායම් හමුව	බෙල්ජියම	24.10.2019	දූත සේවා
කේ. මීගහගේ මයා	අධ්‍යක්ෂ	සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා වූ චීන සංවර්ධන ආධාර ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සම්මන්ත්‍රණය - 2019	චීනය	02.08.2019 - 22.08.2019	පුහුණු

විදේශ නියෝජිතයින් / රැස්වීම් සහ පුහුණුව - 2019					
නම	තනතුර	වැඩසටහන	රට	කාල සීමාව	කරුණ
එච්.එම්.සි.කේ. හේරත් මයා	සහකාර අධ්‍යක්ෂ	රාජ්‍ය මූල්‍ය අවධානම කළමනාකරණය - ජාත්‍යන්තර මූල්‍ය අරමුදල පාඨමාලාව	සිංගප්පූරුව	23.06.2019 - 29.06.2019	පුහුණු
කේ.එම්. කුමාරසිරි මයා	සහකාර අධ්‍යක්ෂ	ආසියානු රටවල් සඳහා වූ ඉහළ මට්ටමේ බදු පිළිබඳ සමුළුව	ජපානය	25.04.2019 - 26.04.2019	රැස්වීම්
ඒ.එන්. බෝපගමගේ මයා	සහකාර අධ්‍යක්ෂ	චීන - ශ්‍රී ලංකා ව්‍යාපාරික සහ සංස්කෘතික හුවමාරුව පිළිබඳ සම්මන්ත්‍රණය - 2019	චීනය	10.10.2019 - 23.10.2018	පුහුණු
වයි.එන්.සී. ද සිල්වා මිය	සංවර්ධන නිලධාරි	සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා වූ නවීන පරිපාලන ක්‍රම සහ ශක්‍යතා ප්‍රවර්ධනය පිළිබඳ සම්මන්ත්‍රණය - 2019	චීනය	24.10.2019 - 13.11.2019	පුහුණු

*ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන දායක වන්නේ කෙසේ ද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

පුහුණු වැඩසටහන් තුලින් ලබන දැනුම රාජකාරි කටයුතු සඳහා භාවිතා කිරීම.

7.0 අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	**අනුකූල වේ**		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	**අනුකූල වේ**		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම (වාණිජ අත්තිකාරම් ගිණුම)		අදාළ නොවේ	
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම		අදාළ නොවේ	
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම	**අනුකූල වේ**		
1.6	වෙනත්			
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	**අනුකූල වේ**		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	**අනුකූල වේ**		
2.3	විගණන විමසුම් ලේඛනය	**අනුකූල වේ**		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
	යාවත්කාලීන කර පවත්වාගෙන යාම			
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස්	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
	කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම			
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
	සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම			
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල වේ		
12	**රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්ට වලට අනුකූල වීම.	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම.	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම		අදාල නොවේ	
15.2	රැස් කර තිබූ ආදයම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම		අදාල නොවේ	
15.3	මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම		අදාල නොවේ	
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
	යාම			
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			2020 වර්ෂයේදී මානව සම්පත් සැලැස්මක් සකස් කරනු ලැබේ.
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම			
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම			

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
	තුළ තහවුරු කොට තිබීම			
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම			
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම			
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } ටීආර්ඊ/සී/ඩීඑෆ්පී/2019/එෆ්ඒ/02 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2020 ජුනි 09 දින

11 JUN 2020

ගණන්දීමේ නිලධාරී

රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ

පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

1.6.1.1. මූල්‍ය වත්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

භාණ්ඩාගාර පොත් අනුව නොපියවන ලද අග්‍රිම ශේෂය රු. 310,093 ක් වුවද එම වටිනාකම මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශය තුළ ජංගම වගකීම් හා මූල්‍ය වත්කම් තුළ නිසි පරිදි දක්වා නොතිබුණි.

1.6.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

ආදායම් සංකේතාංකය 10.02.10.00 සමාජ වගකීම් බද්ද යටතේ පසුගිය වසරට අදාල මුදල් හා පසුගිය වසරට පෙර වසර වන විට හිඟ මුදල් පිළිබඳ උපලේඛන ඉදිරිපත් කර නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 ආදායම් කළමනාකරණය

(අ) 2019 දෙසැම්බර් 31 දින වන විට උක්ත ආදායම් ගිණුමට අදාලව රු. 64,630,999 ක මුදලක් හිඟව පැවතුණි.මෙම ශේෂය තුල වසර 06 ඉක්මවූ රු.63,012,706 ක හිඟ ශේෂයක් පවතින බව නිරීක්ෂණය විය.

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයෙහි 128 (1) ප්‍රකාරව රාජ්‍ය ආදායම එකතු කිරීම සම්බන්ධව කටයුතු කරන ගණන් දීමේ නිලධාරීන් සහ දෙපාර්තමේන්තු විමසා රජයට ලැබිය යුතුව තිබෙන හිඟ ආදායම් අප්‍රමාදව එකතු කර ගැනීම සම්බන්ධව විශේෂ විධිවිධාන යොදවන බවට රාජ්‍ය ආදායම් පිළිබඳ ගණන්දීමේ නිලධාරියෙකු විසින් වගකීමට බැඳේ. එසේ වුවද, මෙම ආදායම් සංකේතාංකයට අදාළ හිඟ ආදායම් අයකර ගැනීමට ගත් පියවරයන් පිළිබඳ විගණනයේදී නිරීක්ෂණය නොවුණි.

2.2 වියදම් කළමනාකරණය

(අ) සමාලෝචිත වර්ෂය තුළ සලසා තිබුණු පුනරාවර්තන හා මූලධන වියදම් වල මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් පිළිවෙලින් සියයට 96 ක් හා සියයට 47 ක් වර්ෂය අවසානය වන විට ඉතිරිවී තිබුණි. ඒ අනුව වාර්ෂික ඇස්තමේන්තු කිරීම් තාත්විකව සිදුකර නොමැති බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ආ) පුනරාවර්තන වියදම් තුල 2006/2007 වර්ෂවල සිංගප්පූරුවේ පැවැත්වූ ජාත්‍යන්තර බේරුම්කරණයේදී ශ්‍රීමා ලංකා පෞද්ගලික සමාගමේ ගැටළු නිරාකරණය කිරීමට අදාළව ගෙවිය යුතු මුදල ලෙස 2019 වර්ෂය සඳහා රු. 1,670,000,000 ක ප්‍රතිපාදන වෙන් කර තිබූ අතර වර්ෂය අවසානයේදී එම මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ඇ) ඇස්තමේන්තුව අනුව 1409 - වෙනත් සේවා වැය විෂය,02,03 හා 04 ලෙස උප ව්‍යාපෘතිවලට බෙදා ඇති ශුද්ධ ප්‍රතිපාදනය 1,683,686,000 ක් වූ නමුදු විසර්ජන ගිණුම තුළ එය උප වැය විෂයයන් යටතේ වෙන් නොකොට එකතුවක් ලෙස සටහන් කර තිබුණි. එම නිසා එහි ඉතිරිවීම් ප්‍රතිශත සියයට 67 සිට සියයට 100 දක්වා සටහන් නොකොට විචලතා පැහැදිලි කිරීමේ ප්‍රකාශයේ එය සියයට 99.80 ක් ලෙස දක්වා තිබුණි.

(ඇ) ප්‍රතිපාදන මාරු කිරීම් සහ ඉතිරිවීම්

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2019 වර්ෂය තුල පුනරාවර්තන වැය විෂයයක රු.15,000,000 ක් වූ ප්‍රතිපාදන මු.රෙ.66-69 ප්‍රතිපාදන යටතේ සියයට 13 ක අඩු කිරීම් ද , වැය විෂයයන් 03 ක එකතුව වූ රු. 8,100,000 ක් වූ ප්‍රතිපාදනයෙන් සියයට 17 සිට සියයට 80 දක්වා වැඩි කිරීම් ද සිදු කර තිබුණි.

(ii) අධි ප්‍රතිපාදන සලසා ගැනිම

සමාලෝචිත වර්ෂයේදි වැය විෂයයන් 08 ක් සඳහා රු.මිලියන 51.91 ක අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා එම ප්‍රතිපාදන උපයෝජනය කළ පසු රු.මිලියන 21.31 ක ප්‍රතිපාදන ඉතිරි වි තිබුණි. එම ඉතිරිය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 20 ක සිට සියයට 75 ක පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

2.3 අත්තිකාරම් නිකුත් කිරිම හා පියවීම

2.3.1 රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් 'බී' ගිණුම

අත්තිකාරම් 'බී' ගිණුම පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) කොළඹ මහ නගර සභාවට ස්ථාන මාරු වී ගිය ඩී.එම්.එස්.ඒ. නිරෝෂණ මහතාගෙන් ආපදා ණය රු. 222,500 ක මුදලක් අය විය යුතුව තිබූ අතර විගණිත දින වන විටත් එම මුදල අය නොවී පැවතුණි.

(ආ) විශ්‍රාම ගිය එච්.එෆ්.පී. ෆොන්සේකා මියගෙන් අයවිය යුතු රු. 232,500 ක ආපදා ණය මුදල් ශේෂය විගණිත දින වන විටත් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3. **මෙහෙයුම් සමාලෝචනය හා කාර්යසාධනය**

ඉදිරිපත් කරනු ලබන මූල්‍ය ප්‍රකාශනවල සඳහන් ආදායම්, වියදම්, වත්කම් හා වගකීම් සම්බන්ධයෙන් මෙහෙයුම් සමාලෝචනය, තිරසාර සංවර්ධනය, යහපාලනය හා මානව සම්පත් කළමනාකරණයට අදාළ විගණන නිරීක්ෂණ ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ලැබේ

නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

එස්.එම්.ඩී.එස්. සුදීෂ් රෝහිත
නියෝජ්‍ය විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය